MINISTRY OF MASS MEDIA AND INFORMATION

සැලසිනෙ
ரூபவாஹினி
SELACINE

TELEVISION INSTITUTE




# වාර්ෂික වාර්තාව ஆண்டறிக்கை ANNUAL REPORT

සැලසිනෙ
සෙනෙජිණ
SELACINE
TELEVISION INSTITUTE

ගරු ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
කොළඹ 5.

ගරු අමාත්‍යතුමනි,

**වාර්ෂික වාර්තාව - 2012**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2012 වසර සඳහා වාර්ෂික වාර්තාව සැලසිනෙ රූපවාහිනී ආයතනය වෙනුවෙන් ගෞරවයෙන් ඉදිරිපත් කරමි.



ප්‍රදීප් එදිරිසිංහ
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 7.

SELACINE TELEVISION INSTITUTE

# පෙළ ගැස්ම


| | |
|---|---|
| දැක්ම මෙහෙවර අරමුණු | 03 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 05 |
| සාමාන්‍යාධිකාරීතුමාගේ සංදේශය | 06 |
| පරිපාලන ව්‍යුහය 2012 හා සම්බන්ධීකරණ තොරතුරු | 07 |
| ආයතනික තොරතුරු | 08-18 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 20-23 |
| ආදායම් ප්‍රකාශය | 24 |
| ශේෂ පත්‍රය | 25 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 26 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 28-37 |
| 2012 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය | 39-45 |
| විගණකාධිපතිතුමාගේ වාර්තාවට පිළිතුරු 2012 | 46-50 |

## දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණයද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනගි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

## අරමුණු

අලෙවි ප්‍රවර්ධනය

- නූතන අභියෝගාත්මක ව්‍යාපාර සහ නව තාක්ෂණ යෝජනා ක්‍රම සඳහා අවතීර්ණ වීම.
- සේවාලාභී නැඹුරුව වැඩිදියුණු කිරීම උදෙසා වන කේන්ද්‍රීය යොමුකිරීම් වැඩිදියුණු කිරීම.

වෙනත්

- ව්‍යවසායාත්මක සංස්කෘතියක් සංස්ථාපනය කිරීම.
- සියලු මානව සම්පත් සංවර්ධනය කිරීම.



# සභාපතිතුමාගේ සමාලෝචනය

සැලසිනෙ රූපවාහිනි ආයතනයේ සභාපතිත්වය භාරගැනීමෙන් අනතුරුව ආරම්භකරණු ලැබූ වාර්ෂික වාර්තාව නිකුත් කිරීමේ කර්තව්‍යය 2009 වාර්ෂික වාර්තාවේ සිට නොකඩවාම නිකුත් කරන ලැබූ අතර 2012 වාර්ෂික වාර්තාවට ද පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලත් භාගයක් සේ සලකමි

පසුගිය තිස්වසරක කාලය තුළ ආයතනය පැමිණි ගමන් මගේ වඩාත්ම කාර්යක්ෂම යුගය නිර්මාණය කිරීමට හැකිවීම මට මහත් සතුටක් ගෙන දෙන කරුණකි. ආදළ ආයතනික පහසුකම් වැඩිදියුණු කිරීම හේතුවෙන් ආයතනික පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට හැකිවිය.

ගිණුම්කරණ කටයුතු නිවැරදිව හා කඩිනම් අයුරින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම තුළින් ඵලදායි ප්‍රතිඵල අත්පත් කරගැනීමට හැකිවිය. එනම් 2011 මූල්‍ය ප්‍රකාශනය මෙන්ම 2012 වසරේ මූල්‍ය ප්‍රකාශනය කෙරෙහිද විගණකාධිපති මතය උසස් ලෙස සනිටුහන් කර තිබීම එයට කදිම නිදසුනකි.

2012 වසර තුලදි මානව සම්පත් උපදේශන සේවාව මගින් ආයතනික සේවකයින් උදෙසා ප්‍රයෝජනවත් ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාත්මක කිරීම ප්‍රශංසනීය කටයුත්තකි. එමගින් නුවරඑළියේ දි පැවැත් වූ Gung Ho සමූහ ක්‍රියාන්විතය මගින් සේවකයින් තුළ සාමූහිකව කාර්යයන් සිදුකිරීමේ හැඟීම් වැඩිදියුණු කර ගැනීම මෙන්ම සේවකයින් වෙත තනි තනිව ලබාදෙන උපදේශන ද ආයතනික ක්‍රියාකාරීත්වයේ වර්ධනයට මහත් පිටුවහලක් වන බව මගේ හැඟීමයි

විවිධ මට්ටමෙහි සේවයේ නියුතු සේවකයින් විවිධවූ ශිල්පීය පඨමාලා කෙරෙහි යොමුකරවීමට හැකිවීම ද මේ වසර තුළදී කැපී පෙනෙන තත්වයක් පිලිබිඹු කෙරේ.

මාධ්‍ය නිෂ්පාදනයන්හි තත්වය උසස් කරනු වස් අධිතාක්ෂණයෙන් හෙබි කැමරාවක් සහ සංස්කරණ යන්ත්‍රයක් නිෂ්පාදන අංශය වෙත ලබාදීමට මෙන්ම එම අංශය වෙත වෘත්තීමය ශිල්පීන් ඇතුලත් කරගැනීමට ද මෙම වසර තුළ දී හැකියාව ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස උසස් තත්වයේ වාර්තාමය වැඩසටහන් රාශියක් නිර්මාණය කිරීමට හැකිවුවා පමණක් නොව එම වසරේ දී විකාශය වූ අකුරු තරඟ නෑ ටෙලි වෘත්තාන්තය රයිගම් ටෙලි සම්මාන උළෙලේ දී ජූරියේ විශේෂ ඇගයුම් සම්මානයෙන් පිදුම් ලැබීමට හැකිවීම ද අප ආයතනය ලැබූ ගෞරව උපහාරයකි. දැන්වීම් නිර්මාණකරණයේදීද අද්විතීය ස්ථානයක වැජඹීමට අප ආයතනයට හැකියාව ලැබී ඇත. ලේක්හවුස් ආයතනය වෙත දෛනිකව ලබාදෙන පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම ප්‍රමාණයක් ලබාදෙන ආයතනය ලෙස අප සැලසිනෙ ආයතනය නම් වී තිබීම අප වෙත තවත් සතුට දනවන කරුණකි.

2011 වසර හා සසඳන විට 2012 වසරේදි ආදායම රු: මිලියන 57 කින් වර්ධනය වූ අතර එය ප්‍රතිශතයක් ලෙස 15% ක වැඩිවීමකි. එම වසරේදි මුළු ආදායම රු: මිලියන 437 කට වැඩි ප්‍රමාණයක් වූ අතර එය මෙතෙක් ලැබූ ඉහළම ආදායම් තත්වය ලෙස ද සැලකිය හැක. ඉහළ ආදායම් ඉලක්ක පසුපස හඹායෑම් තුළින් මෙවැනි ප්‍රගතියක් ලබාගැනීමට හැකිවීම ප්‍රශංසනීය තත්වයකි.

මේ සියලු ජයග්‍රහණයන් සමඟ අපගේ ඒකායන කාර්යභාරය විය යුත්තේ රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ සියලු තතු ජනතාව වෙත ගෙන යාමයි. එම කාර්යය වෙනුවෙන් ඇප කැපවී ඇති සැලසිනෙ ආයතනය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට අවශ්‍ය අඩිතාලම දැමීම අපගේ යුගයේ කාර්යභාරය වී අතර එය සාර්ථකව ඉටුකිරීම අප සැමගේ වගකීම විය යුතුය.

**ප්‍රදීප් එදිරිසිංහ**
**සභාපති**

# සාමාන්‍යාධිකාරීතුමාගේ සංදේශනය



දශක තුනක් පුරා ඉටුකරන ලබන මාධ්‍ය මෙහෙවර තවත් දශක ගණනාවක් පුරා ඉදිරියට පවත්වාගෙන යාමේ අදිටනින් සැලසිනෙ ආයතනය වඩා කාර්යක්ෂමව පවත්නා යුගයක, එනම් 2012 වසර තුළ සිදුකළ කාර්යභාරය සංදේශනය කිරීම මා සතු වගකීමක් සේ සලකමි.

ශ්‍රව්‍ය දෘශ්‍ය නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලී සිටින සේවකයින්ගේ නිපුණතාවයන් සහ හැකියාවන් උද්දීපනය කිරීමේ අරමුණින් මානව සම්පත් උපදේශන සේවාව මගින් ක්‍රියාත්මක කළ Gung Ho සමූහ ක්‍රියාන්විතය සේවකයින්ට මහත් ආස්වාදයක් ගෙනදෙන කරුණක් විය. එමෙන්ම එය ඔවුන්ගේ ක්‍රියාශීලිත්වය වර්ධනය කරගැනිමට ද හේතුවිය. ශිල්පීය පාඨමාලා හැදෑරීමට පහසුකම් සලසාදීම තුළින් සේවකයින්ගේ අනාගත සුබ සිද්ධිය මෙන්ම ආයතනික කාර්යක්ෂමතාවය වැඩිදියුණුවට ප්‍රවේශයක් වනු ඇත. උසස් තත්වයේ මාධ්‍ය නිෂ්පාදනයන් නිර්මාණය කිරීමට අවශ්‍ය උපාංග සේ සැලකෙන නවීනතම කැමරාවක් සහ සංස්කරණ යන්ත්‍රයක් ආයතනය විසින් මිලට ගැනීම 2012 වසර තුළ සිදුකිරීම මඟින් අනාගතයේදී විපුල ඵල නෙලාගැනීමට හැකිවනු නොඅනුමානයි.

සැලසිනෙ ඉතිහාසයේ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් නිෂ්පාදන අංශය විසින් නිර්මාණය කරන ලද ''අකුරු තරහ නෑ'' ටෙලි වෘත්තාන්තය 2012 රයිගම් ටෙලි සම්මාන උළෙලේ දි ජුරියේ විශේෂ ඇගයුම් සම්මානයට පාත්‍රවීම අනාගත සුබ පෙර නිමිත්තකි.

දිනපතා පුවත්පත් සඳහා දැන්වීම්කරණයේදි ඉදිරියෙන්ම සිටීමේ හැකියාව 2012 වසරේදී සැලසිනෙ සතුවීම අපට මහත් සතුටට කරුණකි.

ආයතනයේ මූල්‍ය ගිණුම්කරණ කටයුතුවල කාර්යක්ෂමතාව හා නිවැරදිතාවය තහවුරුවන හොඳම සාක්ෂිය වනුයේ 2012 වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයෙන් විගණකාධිපති මතය, පිට පිටම දෙවන වතාවටත් මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයෙන් පිලිබිඹු කෙරෙන බවයි.

රු මිලියන 450 ක ඉහළ ඉලක්ක ගත ආදායමක් හඹාගිය අලෙවි අංශය එම වසර තුළදී රු.මි. 437 කට අධික ආදායමක් ලබාගැනීමට සමත්වීම මඟින් අලෙවි සහ පාරිභෝගික සේවා අංශයේ නිපුණත්වය කියාපාන්නකි. 2011 වසර හා සැසඳීමේ දී රු. මිලියන 57ක වැඩිවීමක් වන අතර වැඩිවීමේ ප්‍රතිශතය 15%කි.

සේවක සුභ සාධනය උදෙසා එහි සුභ සාධක සංගමය විසින් ප්‍රශංසනීය සේවයක් ඉටුකරනු ලැබීය. සහනදායි පොලී අනුපාතයකට යටත්ව ණය පහසුකම් ලබාදීම්, අවමංගල්‍ය ආධාර දීමනා, සේවක දු දරුවන් වෙත පොත්පත් ලබාදීම මෙන්ම සේවයෙන් ඉවත්ව යන සේවකයින් වෙත දීමනා ලබාදීම ද 2012 වසර තුළදී ක්‍රියාත්මක වූ සේවාවන්ය.

**රංජන් ඒකනායක**
**සාමාන්‍යාධිකාරී (වැ.බ.)**

# පරිපාලන ව්‍යුහය - 2012

**ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය**

ප්‍රදීප් විදිරිසිංහ - සභාපති

උපුල් පල්ලෙගංගොඩ - සාමාන්‍යාධිකාරී (2012. 09. 30 දක්වා)
රන්ජන් ඒකනායක - සාමාන්‍යාධිකාරී (වැ.බ.) (2012. 10. 30 සිට)

**කළමනාකරණය**

පුෂ්පා බමුණුආරච්චි - කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන)

සුනන්ද වීරසිංහ - කළමනාකරු (නිෂ්පාදන)

ධම්මික ජීරසිංහ - පාරිභෝගික සේවා අධ්‍යක්ෂ

නලීන් අලහකෝන් - කළමනාකරු (මාධ්‍ය)

කේ. ඩී. ජේ. ද ලාසාල් - කළමනාකරු (මූල්‍ය)

සුජිත් පුෂ්පකුමාර - කළමනාකරු (වැ.බ.) (ග්‍රැෆික්)

**විගණක**

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

**බැංකුකරුවන්**

ලංකා බැංකුව

# සම්බන්ධීකරණ තොරතුරු

**ලිපිනය**
ශ්‍රවන් විදුලි සංස්ථා අභ්‍යාස ගොඩනැගිල්ල, නිදහස් චතුරස්‍රය, කොළඹ 07
**දුරකථනය**
011 2688744 /011 5767979/ 011 5235480
**ෆැක්ස්**
011 2688745
**විද්‍යුත් තැපැල**
selacine@gmail.com
**වෙබ් අඩවිය**
www.selacine.lk

# ආයතනික තොරතුරු

**නාමය** : සැලසිනෙ රූපවාහිනී ආයතනය

**නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය :**

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982-1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවිදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001. 12. 20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය යටතට පවරාගන්නා ලදී.
- 2004. 04. 28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

**ආයතනික කාර්ය භාරය :**

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුලත් කෙරුණි.
  - i මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
  - ii රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
  - iii රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008. 12. 02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008. 12. 24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු

### 2012 ආයතනික ජයග්‍රහණ

- සැලසිනෙ නිෂ්පාදනයක් වූ "අකුරු තරහ නෑ" ටෙලි වෘත්තාන්තය 2012 රයිගම් ටෙලි නාට්‍ය උළෙලේ දී ජූරියේ විශේෂ ඇගයුම් සම්මානයෙන් පිදුම් ලැබීය.
- 2012 මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ තත්වාගණනය කළ මතය මගින් පිටපිටම දෙවන වතාවටත් සැලසිනෙ ගිණුම් කටයුතු ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයෙන් පිළිබිඹු කෙරෙන බැව් ප්‍රකාශ කිරීම සැලසිනෙ ආයතනය ලැබූ තවත් ජයග්‍රහණයකි.

  "2012 දෙසැම්බර් 31 දිනට සැලසිනෙ රූපවාහිනී ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එකී මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ."

  විගණකාධිපති

### එදා මෙදාතුර

### ජනහද දිනූ සැලසිනෙ නිර්මාණ

● **පොළෝ ගැබින් දිය ගෙනා වගයි** *(වාර්තාමය)* ● **මණිමේඛලා** *(වාර්තාමය)* ● **සප්ත සමාධි** *(වාර්තාමය)* ● **නිවසින් බැහැර නිවසක්** *(වාර්තාමය)* ● **හිම හංසි** *(ටෙලි වෘත්තාන්තය)* ● **2001 කෙසේ යමුද** *(වාර්තාමය)* ● **කේබල් පිරිද්දීමේ ක්‍රම** *(වාර්තාමය)* ● **පැතුම් දහරක්** *(වාර්තාමය)* **වැව් ගමක කථාවක්** *(වාර්තාමය)* ● **නිම්නයේ නිධානය** *(වාර්තාමය)* ● **විමංසා** *(වාර්තාමය)* ● **කජුගස් වල මල් පිපිලා** *(වාර්තාමය)* ● **කළු දියමන්තියේ කථාව** *(වාර්තාමය)* ● **56 දරුවෝ** *(වාර්තාමය)* ● **සියවසක පියසටහන්** *(වාර්තාමය)* ● **අපේ උරුමය** *(වාර්තාමය)* ● **ශ්‍රී ලංකා අක්ෂිදාන සංගමය** *(වාර්තාමය)* ● **සංවර්ධනයේ පියසටහන්** *(වාර්තාමය)* ● **රැකවරණයේ පුරෝගාමියා** *(වාර්තාමය)* ● **රාග රංගන** *(වාර්තාමය)* ● **මෙහෙවර** *(වාර්තාමය)* ● **අරුණ උදාවේදෝ** *(වාර්තාමය)* ● **ගමේ ගොහින්** *(වාර්තාමය)* ● **අසිරිමත් මාරුත - පොල්** *(වාර්තාමය)* ● **දින 145ක කථාවක්** *(වාර්තාමය)* ● **අකුරු තරහ නෑ** *(ටෙලි වෘත්තාන්තය)* ● **ජීවිත රෝදේ** *(ඒකාංගික ටෙලිනාට්‍ය)* ● **මාවතේ අපි** *(අර්ධ වෘත්තාන්ත වාර්තාමය)* ● **ජලය ජීවයේ උල්පතයි; එය මතු පරපුරේ දායාදයයි** *(වාර්තාමය)* ● **බෙරවත** *(වාර්තාමය)* ● **වන වත** *(වාර්තාමය)* ● **තේ දල්ලක අසිරිය** *(සඟරාමය)* ● **සිපිරි ගෙදරින් සුපිරි පාඩමක්** *(වාර්තාමය)* ● **සුව ඔසුවකි ඇවිදිමු සකි** *(වාර්තාමය)* ● **ධාන්‍ය සංරක්ෂණය** *(වාර්තාමය)* ● **දැයට සවිය මව් පදවිය** *(වාර්තාමය)* ● **සීගිරිය ජල කළමනාකරණය - සිංහල/ඉංග්‍රීසි** *(වාර්තාමය)* ● **වැවක මහිම බල ජල කඳ පිරීලා** *(වාර්තාමය)* ● **සමනල වැව යපස්** *(වාර්තාමය)* ● **බෝ නොවන රෝග බෝවන්නේ ඇයි** *(වාර්තාමය)* ● **බිසෝ කොටුව - සිංහල /ඉංග්‍රීසි** *(වාර්තාමය)* ● **සතිපොළක අසිරිය** *(වාර්තාමය)* ● **ජේතවන දාගැබේ ඉදිකිරීම් තාක්ෂණය සිංහල /ඉංග්‍රීසි** *(වාර්තාමය)* ● **නිම් වළලු පුළුල් කළ අපේ ගුවන** *(වාර්තාමය)* ● **ශ්‍රී ලංකාවේ පැරණි පහන් - සිංහල / ඉංග්‍රීසි** *(වාර්තාමය)* ● **අපේ ප්‍රවාහනයේ හෙට දවස** *(වාර්තාමය)* ● **අසිරිමත් විකිරණ** *(වාර්තාමය)* ● **හෙට වෙනුවෙන් අද** *(ප්‍රචාරණ දැන්වීම්)* ● **දක්ෂිණ අධිවේගී මාර්ගය** *( ප්‍රචාරණ දැන්වීම්)* ● **ජන ලේඛන හා සංඛ්‍යාලේඛන** *(ප්‍රචාරණ දැන්වීම්)*

## 2012 වසරේදී 30 වන සාංවත්සරික සැමරුම් විශේෂාංග

- 2102 පෙබරවාරි 17 වන දින සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනයක් සහ පසුදින උදෑසන සංඝගත දක්ෂිණාවක් ආයතන පරිශ්‍රය තුළදී පැවැත්වීය.

  එදිනම මහ පිරිත් දේශනය ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් සජීවීව විසුරුවා හරින ලදී.

- 30 වන සංවත්සරය නිමිත්තෙන් විශේෂ පුවත්පත අතිරේකයක් ලේක්හවුස් ඇතුළු අනෙකුත් පුවත්පත් ආයතනවල පුවත්පත්හි පල කෙරුණි.

- සැලසිනෙ ආයතනය සහ සේවක සුභ සාධක සංගමයේ දායකත්වයෙන් ආබාධිත පුද්ගලයකු වෙනුවෙන් රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී.

- සැලසිනෙ ආයතනයේ අනුග්‍රහය මත සේවක සුභ සාධක සංගමයේ සංවිධායකත්වයෙන් යුතුව ලේ දන්දීමේ ව්‍යාපාරයක් 2012 ජුනි මස 8 වන දින දවස පුරා ආයතන පරිශ්‍රය තුළදී පවත්වන ලදී.

## 2012 වසරේදී ක්‍රියාත්මක වූ විශේෂිත කාර්යයන්

- මානව සම්පත් උපදේශන සේවාව යටතේ "ව්‍යවසායකත්ව සංස්කෘතිය" නමින් විශේෂ වැඩමුළුවක් ආයතනයේ කළමනාකරුවන් හා ජ්‍යේෂ්ඨ නිලධාරීන් වෙනුවෙන් 2012. 01. 12 දින කොළඹ ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයේ දී පවත්වනු ලැබීය.

- මානව සම්පත් උපදේශන සේවාව යටතේ ක්‍රියාත්මක කාර්ය සාධන සැලැස්මට අනුව Gung Ho සමූහ ක්‍රියාන්විතය නමින් විශේෂ වැඩසටහනක් ආරම්භ කෙරුණි. එහි ආරම්භක පියවර ලෙස සාමූහිකත්වය ගොඩනැංවීම ( Team Building ) යන තේමාව යටතේ විශේෂිත ක්‍රියාකාරකම් සහිත වැඩමුළුවක් 2012 මාර්තු 31 සහ අප්‍රේල් 1 යන දෙදින තුළ නුවරඑළිය අඹේවෙලදී පවත්වනු ලැබීය.

- ජාතියේ සිසු පරපුර වෙනුවෙන් දුරකථන මාර්ගයෙන් අධ්‍යාපනික උපකාරක සේවාවක් ලෙස " Call Teacher" නවතම ව්‍යාපෘතියක මූලික කටයුතු ආරම්භ කෙරුණි.

- ගාල්ලේ කොටුව සහ මාතර පොල්හේන වෙරළාසන්නය කේන්ද්‍රකරගත් වාර්ෂික විනෝද චාරිකාව 2012 නොවැම්බර් 24 දින පැවැත්වීය.

- Sony F3 නමින් හැඳින්වෙන නවීනතම සිනමා කැමරාවක් සහ Non - Liner Video Editing Systm ලෙස හැඳින්වෙන සංස්කරණ යන්ත්‍රයක් ද මිල දී ගැනීම ද 2012 වසර තුළදී සිදුවිය.

## සැලසිනෙ සේවක සුභ සාධක සංගමය

වසර ගණනාවක් පුරා අක්‍රියව පැවති සැලසිනෙ සේවක සුභ සාධක සංගමය වර්තමාන සැලසිනෙ සභාපතිතුමාගේ සම්ප්‍රාප්තියත් සමඟ සක්‍රීය කිරීමේ කාර්ය සිදුවිය. අද එකී සංගමය ඉතා ඉහළ ක්‍රියාකාරීත්වයකින් යුත් සුභ සාධක සංගමයක් ලෙස හැඳින්විය හැක.

## පසුගිය දෙවසර තුළ සිදුකළ කාර්යයන්

- 2010 පොසොන් උළෙල නිමිත්තෙන් බියගම මල්වානේ පිහිටි බාලිකා ළමා නිවාසයක් වෙත ජනප්‍රිය ටෙලිනාට්‍ය ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් යුතුව දානමය පිංකමක් පවත්වන ලදී.

- සංගමයට ආධාර පිණිස ලොතරැයි දිනුම් ඇදීමක් පවත්වා ජයග්‍රාහකයන් අතර වටිනා ත්‍යාග පිරිනමන ලදී. එමගින් රු.50,000/- කට ආසන්න මූල්‍ය ආදායමක් සංගමයට ලබාගත හැකිවිය.

- සේවක අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් 2010.10.01 සහ 2011.04.01 යන දිනවලදී වාර්ෂික සුහද හමු පැවැත්වීය.

- සංගමයේ සංවිධානත්වය මත 2011.06.04 දින වැලිකඩ බන්ධනාගාර ක්‍රීඩාපිටියේ දී අන්තර් ආංශික ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීය.

- 2011 පොසොන් උළෙල නිමිත්තෙන් 2011.06.15 දින පන්නිපිටියේ "මහ ගෙදර" වැඩිහිටි නිවාසයේ ප්‍රකට ගුවන් විදුලි හා රූපවාහිනී ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් දානමය පුණ්‍යකර්මයක් පවත්වා රෙදි සෝදන යන්ත්‍රයක් ඇතුළු වටිනා ත්‍යාග භාණ්ඩ රාශියක් එම නිවාසයට පිරිනමන ලදී.

- සංගමයේ සාමාජිකයින් වෙත රු. 10,000/- ක උපරිමයකට සහ සහනදායි පොලී අනුපාතයකට යටත්ව ණය පහසුකම් ලබා දීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

- මව /පියා ඇතුළු සේවක පවුලේ අවමංගල්‍ය අවස්ථාවක දී රු. 10,000/- ක දීමනාවක් පිරිනැමීමේ යෝජනා ක්‍රමය.

- වාර්ෂිකව සේවකයින්ගේ පැසැල් දරුවන්ට පොත්පත් ලබාදීමේ වැඩපිළිවෙල

- සේවකයකු සේවයෙන් සහ සංගමයෙන් ඉවත්ව යාමේදී රු: 5,000/- ක දීමනාවක් ලබා දීමේ වැඩපිළිවෙල.

## නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

පසුගිය වසරේදී විශිෂ්ටතම කාර්ය සාධන අංශය ලෙස පිදුම් ලැබූ නිර්මාණ සහ ග්‍රැෆික් අංශය මෙම 2012 වසරේ දී ද සුපුරුදු ලෙස ඉතා කාර්යක්ෂම තම කාර්ය සාධනයේ යෙදුණි.




2012 වසරේ අගභාගයේ පටන් නව කළමනාකරුවකුගේ මූලිකත්වයෙන් මෙම අංශයේ කාර්යභාරය වඩාත් තිව්‍ර කෙරුණි. පළපුරුදු වෘත්තිකයින්ගෙන් සමන්විත ග්‍රැෆික් අංශය, පුවත්පත් දැන්වීම් නිර්මාණකරණය, ත්‍රිමාණකරණය, ත්‍රිමාණ සජීවිකරණය, පෝස්ටර්, බැනර් ඇතුළු විවිධ ප්‍රකාශන නිර්මාණ ආදි බොහෝ නිර්මාණයන්ගේ ආයතනික කේන්ද්‍රස්ථානය වේ.

ග්‍රැෆික් අංශයේ නිලධාරීන්ගේ පරිගණක දැනුම තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් ත්‍රිමාණ සජීවීකරණය පිළිබඳ පරිගණක පාඨමාලාවක් ක්‍රියාත්මක කෙරුණි. සැලසිනෙ රූපවාහිනී ආයතනය ආදායම දෙගුණ කිරීමේ වැඩපිළිවෙළට දායකත්වය සැපයීමේ අරමුණ ඇතිව නිර්මාණ හා ග්‍රැෆික් අංශයේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව ඉටුකෙරුණි. ඒ අනුව ලේක්හවුස් ආයතනය වෙත ලැබෙන දෛනික පුවත්පත් දැන්වීම් අතුරින් වැඩිම පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් ලබාදෙන ආයතනය ලෙස සැලකෙන සැලසිනෙ ආයතනය තුළ දැන්වීම් නිර්මාණකරණයෙහි වගකීම පැවරී තිබෙනුයේ නිර්මාණ හා ග්‍රැෆික් අංශය වෙතය.

# අලෙවි සහ පාරිභෝගික සේවා අංශය




පසුගිය වසර තුළ අලෙවි ප්‍රවර්ධනාත්මය වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කිරීම තුළින් මහඟු ප්‍රතිඵල රාශියක් ළඟා කරගත් අලෙවි හා පරිභෝගික සේවා අංශය, 2012 වසරේදී තම කාර්යභාරය ආරම්භ කරනු ලැබයේ වාර්ෂික ආදායම රු: මිලියන 450 ක ඉලක්කයක් කරා හඹා යෑමේ අරමුණෙනි.

පළපුරුදු අලෙවි නිලධාරින්ගෙන් සහ නවක නිලධාරින් ගෙන් ද සමන්විත බල ඇණියක් ලෙස හැඳින්විය හැකි අලෙවි අංශයේ ක්‍රියාකාරිත්වය කැපීපෙනෙන ලෙස ඉහළ මට්ටමක තිබුණි. සමාන්‍යධිකාරිතුමා ඇතුළු ඉහළ නිලධාරින්ගේ දැඩි සුපරික්ෂණය යටතේ ක්‍රියාත්මක වු අලෙවි සේවා අංශය 2012 වසරේදී ඉලක්කගත ආදායමට මඳක් අඩුවෙන් එනම් රු: මිලියන 437 කට අධික ආදායමක් ලබාගැනීමට සමත් විය. 2011 වසර හා සංසන්දනයේ දි රු: මිලියන 57 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. එය පසුගිය වසරට වඩා 15% ක වැඩිවීමකි.

එක්වරම ඉතා ඉහළ ඉලක්කයක් කරා හඹායාමේදි අලෙවි අංශය අත්කරගත් ප්‍රගතිය ප්‍රසංශනියයි. ඇතැම් නිලධාරීන්ට අන්තර්ජාල සහ විද්‍යුත් තැපල පිලිබඳ එක්දින පුහුණු වැඩසටහන්වලට යොමුකරන ලද අතර “මනා අලෙවි හැඩගැස්මක් තුලින් සුහද පාරිභෝගික සේවාවක්” නමින් විශේෂ පුහුණු වැඩ සටහනක් යොමුකරන ලද අතර අලෙවි අංශයේ සියලු නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලැබීය.

## මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රධානතම කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි දැන්වීම් හා ශ්‍රව්‍ය දෘශ්‍ය නිපැයුම් උපලේඛනගත කිරීම 2012 වසර තුළ දී වඩාත් කාර්යක්ෂම ලෙස සිදුකරන ලදී. දැන්වීම් පලවීම සම්බන්ධව මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි විකාශනයන්හි පසුවිපරම් සිදුකිරීම ද එම අංශයේ දෛනික කාර්යයක් බවට පත්ව ඇත.

2012 වසර තුළදී ලේක්හවුස් පුවත්පත් ආයතනය වෙත ලැබුණු දැන්වීම් අතරින් වැඩිම දැන්වීම් ප්‍රමාණයක් උපලේඛගතකර තිබෙනුගේ සැලසිනෙ මාධ්‍ය අංශය විසිනි.

සැලසිනෙ ආයතනය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ දැන්වීම් ප්‍රචාරණ ආයතනයක් ලෙස එයින් පිළිබිඹු වේ. මාධ්‍ය නිෂ්පාදනය පමණක් නොව දැන්වීම් නිර්මාණය පිළිබඳව ඉහළ මට්ටමේ හැකියාවක් සැලසිනෙ ආයතනය සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අනුග්‍රහය මත "ජනසංගණනය" හා විදුලිබල මණ්ඩලයේ අනුග්‍රහය මත "හෙට වෙනුවෙන් අද" යන ප්‍රචාරක දැන්වීම් මාලාව සහ "අකුරු තරහ නෑ" සිංහල හා දෙමළ ටෙලි වෘත්තාන්තය ද ජනතාව අතර වඩාත් ප්‍රසාදයට පත්විය.



## නිෂ්පාදන අංශය




මාධ්‍ය නිෂ්පාදන කාර්යයන්ට අදාළ සැලසුම් සකස්කර ක්‍රියාත්මක කිරීමේ වගකීම උසුලනුයේ නිෂ්පාදන අංශයයි. රූපවාහිනී වාර්තාමය වැඩසටහන් මෙන්ම ගුවන්විදුලි හා රූපවාහිනී වෙළෙඳ දැන්වීම් ආදී ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්ට අයත් විවිධ වූ නිෂ්පාදන කාර්යයන්හි නියැලෙමින් 2012 වසරේදී විශේෂිත වූ ප්‍රගතියක් ලබාගැනීමට නිෂ්පාදන අංශය සමත් විය.

පිටපත් රචනයට අදාළ තොරතුරු රැස්කිරීම, පිටපත් රචනය, දර්ශනතල තෝරාගැනීම හා නිර්මාණ ශිල්පීන් තෝරාගැනීම ආදී පෙර නිෂ්පාදන කටයුතු මෙන්ම ශබ්ද පරිපාලනය, සංස්කරණය සහ විශේෂ ප්‍රයෝග වැනි කාර්යයන්ද ඉතා ඉහළ මට්ටමින් සිදුකිරීමේ ඇති හැකියාව 2012 වසර තුළදී සිදුකළ නිර්මාණ තුළින් මනාව පැහැදිලි වේ. “සුව ඔසුවකි ඇවිදිමු සකි”, “දැයට සවිය මව් පදවිය”, “සීගිරිය ජල කළමනාකරණය”, “වැවක මහිම බල ජලකඳ පිරීලා”,“සමනල වැව යපස්”, “බෝ නොවන රෝග බෝවන්නේ ඇයි”,“බිසෝ කොටුව”,“සතිපොළක අසිරිය”, “ජේතවන දාගැබේ ඉදිකිරීම් තාක්ෂණය” යනාදී වාර්තාමය වැඩසටහන් 2012 වසරේදී වඩාත් ආකර්ෂණීය වැඩසටහන් ලෙස ප්‍රසාදය දිනා ඇත.

රූපවාහිනී කැමරාකරණ පාඨමාලාව සහ පරිගණක මෘදුකාංග පුහුණු වැඩසටහන් සඳහා ද මේ අංශයේ ඇතැම් නිලධාරීහු සහභාගි වූහ.

ලොව දැනට නිපදවා තිබෙන අධිතාක්ෂණයෙන් යුත් කැමරාවක් වන Sony PMW-F-3L කැමරාව විශාල මුදලක් ගෙවා මිලදී ගැනීම මෙන්ම එම කැමරාව පිළිබඳ විශේෂ වැඩමුළුවක් 2012 අප්‍රේල් මාසයේදී පවත්වනු ලැබීය. එමෙන්ම Non - Liner Video Editing System ලෙස හැඳින්වෙන සංස්කරණ යන්ත්‍රයක් ද මෙම වසර තුලදී මිලට ගැනීමට නිෂ්පාදන අංශයට හැකිවිය.

## මානව සම්පත් හා පරිපාලන අංශය

මානව සම්පත් හා පරිපාලන අංශය විසින් 2012 වසර තුළදී සුවිශේෂ කාර්යභාරයන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. මානව සම්පත් උපදේශන සේවාව යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් කීපයක් ඒ අතුරින් කැපී පෙනුණි.

2012.01.12 දින ආයතන කළමනාකරුවන් හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙනුවෙන් කොළඹ ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයේ දී පවත්වනු ලැබූ "ව්‍යවසායකත්ව සංස්කෘතිය" නමින් විශේෂ වැඩමුළුවක් පවත්වනු ලැබීය. එමෙන් එකී උපදේශන සේවාව යටතේ මුළු කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාත්මක කාර්ය සාධන සැලැස්මට අනුව Gung Ho සමූහ ක්‍රියාන්විතය නමින් විශේෂ වැඩසටහනක් ආරම්භ කෙරුණි. එහි පළමු පියවර වශයෙන් සාමූහිකත්වය ගොඩනැංවීම (Team Building) යන තේමාව යටතේ විශේෂ ක්‍රියාකාරකම් සහිත වැඩමුළුවක් 2012 මාර්තු 31 සහ අප්‍රේල් 01 යන දෙදින තුළ නුවරඑළිය අඹේවලදී පවත්වනු ලැබීය.


සේවක කුසලතාව වර්ධනය කරගැනීම සහ ඔවුන්ගේ අභිවෘද්ධිය උදෙසා විවිධාකාර පාඨමාලා හැදෑරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලැබීය. සියලු සේවකයින් සඳහා පරිගණක Microsoft office පාඨමාලාව හැදෑරීමට පහසුකම් සලසාදෙනු ලැබීය. ඊට අමතරව පරිගණක ග්‍රැෆික් නිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ග්‍රැෆික් අංශයේ නිලධාරීන් වෙත අවස්ථාව සලසාදෙනු ලැබීය. මිලෝද්‍රා ආයතනය විසින් සංවිධානය කරනු ලැබූ අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල පිළිබඳ එක් දින වැඩමුළුවක් සඳහා අදාළ නිලධාරීන්ව යොමුකරවන ලදී. එමෙන්ම එම වසර තුළදී විදුලි තාක්ෂණ ශිල්පීය පාඨමාලාවක් හැදෑරීම සඳහා සේවක මහතුන් වෙත අවස්ථාව සලසා දෙනු ලැබීය. තවද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිති ක්‍රියාත්මකවීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය වෙනුවෙන් ගිණුම් අංශයේ නිලධාරීන් සහභාගිකරවීමට ද හැකිවිය. මෙයට අමතරව ප්‍රසම්පාදන කාර්යාවලිය විධිමත්ව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සිදුවූ අතර, ප්‍රවාහන සේවා සැලසුම් කිරීම, වාහන නඩත්තුව හා ඉන්ධන සැපයුම් පාලනය කිරීම ආදි ප්‍රවාහනයට අදාළ කාර්යයන්ද මෙම අංශය විසින් මනාව සිදුකරනු ලැබීය.

2012 නොවැම්බර් 24 දින ගාල්ල කොටුව සහ මාතර පොල්හේන වෙරළාසන්නය කේන්ද්‍රකරගත් වාර්ෂික විනෝද චාරිකාව සඳහා ද මානව සම්පත් හා පරිපාලන අංශයේ අනුග්‍රහය ලබා දෙනු ලැබීය.



## මූල්‍ය අංශය

පසුගිය වසරේදී නව විධික්‍රම හඳුන්වාදීමෙන් අනතුරුව ඇරඹි මූල්‍ය කාර්යක්ෂමතාවය 2012 වසරේදී ද වඩාත් හොඳින් ක්‍රියාත්මක විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලු ගිණුම් කටයුතු ක්‍රමවත්ව සිදුකෙරුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා විශේෂ සැලැස්මක් ක්‍රියාත්මක කර එමඟින් විපුල ප්‍රයෝජන අත්කරගැනීමට මෙම අංශය සමත්විය.




අභ්‍යන්තර විගණන අංශය පිහිටුවීම තුළින් මෙම වසරේදී ද ගිණුම් කටයුතු වඩාත් නිරවුල් විය. අනෙකුත් අංශ සමඟ කෙරෙන ලිපිගනුදෙනු වඩාත් කාර්යක්ෂම අයුරින් මෙම 2012 වසරේදී ද ක්‍රියාත්මක විය.


ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමිති ක්‍රියාත්මකවීම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය වෙනුවෙන් ගිණුම් අංශයේ නිලධාරීන් ද සහභාගිවීම තුළින් එම නිලධාරීන්හට එහි දැනුවත්භාවය වර්ධනය කර ගැනීමට හැකිවිය.

2011 වසරේදි මෙන්ම 2012 වසරේදි ද මූල්‍ය ප්‍රකාශනය විධිමත් අයුරින් සකස් කෙරුණි. ඒ අනුව පිටපිටම දෙවන වතාවටත් විගණකාධිපති වාර්තාව මඟින් මූල්‍ය තත්ත්වය සහ 2012. 12. 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එකී මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවට විගණකාධිපති මතය ප්‍රකාශ වී ඇත.


මෙමගින් මූල්‍ය අංශයේ විසින් කරනු ලබන ගිණුම්කරණයන්හි නිවැරදිතාවය හා කාර්යක්ෂමතාවය වඩාත් හොඳින් පිළිබිඹු වේ.

# මූල්‍ය වාර්තා 2011


## ආදායම් වර්ධනය





## පසුගිය වසර පහ තුළ ආදායම් සහ වියදම



## 2007- 2012 වසරයන් අතර ආයතනික ලාභයේ උපනතිය




## 2007 හා 2008 වසර වල පුද්ගලයකු ඉපයූ ආදායම සහ ආයතනය පුද්ගලයකු වෙනුවෙන් දරන ලද පරිපාලන වියදම සැදීම.




පු. ඉ. සා. ආදායම = සමස්ත ආදායම / නිලධාරි සංඛ්‍යාව

පු. වැ. වි. = පරිපාලන වියදම් / නිලධාරි සංඛ්‍යාව

**2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**ගිණුම් ප්‍රතිපත්ති**

**1. පොදු කරුණු**

**1.1 සංයුක්ත තොරතුරු**

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන්, හැඳින්වෙන) 2005-12-08 දිනැති අංක 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

**1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය**

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

**1.3 සේවක ප්‍රමාණය**

2012-12-31 දින වන විට ස්ථිර සේවකයින් 15ක් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 33ක් සිට ඇත.

**2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සංක්ෂිප්තය**

**2.1 පොදු ප්‍රතිපත්ති**

මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මඟ පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලවය.

**2.2 ස්ථායිතාවය සහ සැසැඳුම්**

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදාගත් ප්‍රතිපත්ති සමග අනුකූල වේ.

**2.3 ණය පිරිවැය**

මෙහි ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙසය.

**3. වත්කම් තක්සේරුව සහ එහි අගයුම් පදනම**

**3.1 දේපළ, පිරියත සහ උපකරණ**

පිරිවැය හෝ ප්‍රත්‍යගණන ගණනය මත දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා කර ඇත.

**3.2 වෙළඳ හා ලැබිය යුතු වෙනත් දෑ**

වෙළඳ හා ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

**3.3 මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් සහ මුදල් සමාන දෑ සඳහා අතේ ඇති මුදල් සහ බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු ඇතුළත් වේ.

**3.4 කල්බදු වත්කම්**

කල්බදු පිළිබඳ නියමයන් හි දි අයිතිය දැක්වෙන සියලු අවදානම් සහ පාරිතෝෂිකයන් මූල්‍ය කල්බදු ලෙස වර්ගීකරණය කිරීම සැලසිනෙ උපකල්පනය කරයි. කල්බදු පිළිබඳ මූලික හඳුන්වා දීමේදී එහි අවම කල්බදු ගෙවීමේ දී එහි සාධාරණ අගයේ සහ වර්තමාන අගයන් ට වඩා අඩු සමානත්වයක් ගණනය කිරීමේ දී සිදුවේ. මූලික හැඳින්වීමෙන් අනතුරුව වත්කම් සඳහා යොදා තිබෙන ගිණුම් ප්‍රතිපත්තින්ට අනුකූලව වත්කම් ගණනය කරනු ලැබීය.

**3.5 ක්ෂය කිරීම්**

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගත කර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදුකර ඇත.

දේපල පිරියත හා උපකරණ අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ලී බඩු සහ සවිකිරීම් | වර්ෂ 2-5 |
| පරිගණක උපාංග | වර්ෂ 3-5 |
| කාර්යාලීය උපකරණ | වර්ෂ 5 |
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කැමරා උපකරණ | වර්ෂ 5 |
| ගිණුම්කරණ මෘදුකාංග | වර්ෂ 5 |

ආයතන ප්‍රතිපත්තිය අනුව ප්‍රවර්ථන වර්ෂයේ මිලදී ගන්නා වත්කම් එම වර්ෂයේදී ක්ෂය සඳහා වෙන් කරනු නොලැබේ.

**4 වගකීම් සහ ප්‍රතිපාදන**

**4.1** ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ඉල්ලුම මත ගෙවීමට ඇති ජංගම වගකීම් ශේෂ පත්‍රයෙහි වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් දීර්ඝ කාලීන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

**4.2 විශ්‍රාම පාරිතෝෂික දීමනා**

1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනතට අනුකූලව ඒ යටතේ වසර 5 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

**4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම්**

සේවය අවසන් කළ සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුමක් ලෙස යම්කිසි අයතනයක් මගින් තවත් ආයතනයකට ගෙවන්නා වූ ස්ථිර දායකත්වයක් හැර තවදුරටත් වෙනත් ගෙවීමක් කිරීමට නෛතික හෝ අර්ථකාරී බැඳීමක් නොමැති සේවක ප්‍රතිලාභ සැලසුමක් අර්ථ දැක්වූ දායකත්ව සැලසුමක් වේ. සියලුම සේවකයින් ආවරණය කරන පරිදි අර්ථසාධක හා භාරකාර අරමුදල් සඳහා දායකත්වය සැලසීමට ඇති බැඳීමකින් කරන ගෙවීම් ලාභ/අලාභ ගිණුම සඳහා වියදමක් ලෙස එය කරන්නා වූ අවස්ථාවේදීම හඳුන්වනු ලැබේ. සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාළ නීති හා රෙගුලාසි වලට අනුකූලව සේවායෝජකයාගේ දායකත්වය ලැබීමට සේවක-යින් සුදුසුකම් ලබයි.

සේවක දල වැටුපෙන් 15%ක් හා 3%ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල් වෙත සැලසිනෙ දායකත්වය ලබා දෙයි.

**5. ආදායම් ප්‍රකාශය**

**5.1 පිරිවැටුම**

සැලසිනෙහි පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණය සහ රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

**5.2 අදායම් හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා එන බවට සහ ඒ තුළින් විශ්වාසීව ස්ථිර ලෙස ආදායම් ගණනය කළ හැකි ලෙස ආදායම් ඉපැයීම අදායම් ලෙස හඳුනා ගැනේ.

**5.3 වියදම් හඳුනා ගැනීම**

ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ දරන ලද පිරිවැය සහ විශේෂිත වූ ආදායම් අයිතමයන්හි ඉපැයීම් අතර ඍජු සම්බන්ධතාවයෙහි පදනම මතය.

**6. අදාළ පාර්ශව අතර ගනුදෙනු**

ගිණුම් ප්‍රකාශනයෙහි සඳහන් කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදු කර නොමැත.

**7. ශේෂ පත්‍රයට පසු ගැළපුම් සටහන්**

මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නෙ-ාමැත.

**8.** ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් පරිදි ප්‍රමුඛ බැංකුවේ පැවති රු. 300,000ක තැන්පතුව, ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ ගිණුමට මාරු කර ඇත.

**9.** 2011 වර්ෂයෙ ණයගැති ලේඛණයෙන් කපාහැරීම්, සම්මුච්ත ලාභයට ගලපා නිවැරදි කර ඇත.

**10.** ණය ගැතියෝ සඳහා අඩමාන ණය ලෙස 5 වෙන් කර තිබේ.

SELACINE TELEVISION INSTITUTE

# ආදායම් ප්‍රකාශය

2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| | සටහන් | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ආදායම් | 11 | 437,939,421 | 380,317,637 | 143,590,886 |
| අඩු කළා : | | | | |
| සෘජු පිරිවැය | 12 | 372,938,887 | 341,854,183 | 123,864,022 |
| දල ලාභය | | 65,000,534 | 38,463,454 | 19,726,864 |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 13 | 810,873 | 313,930 | 84,788 |
| | | 65,811,407 | 38,777,384 | 19,811,652 |
| අඩු කළා : | | | | |
| බෙදාහැරීමේ වියදම් | 14 | 7,392,272 | 3,440,965 | 996,248 |
| පරිපාලන වියදම් | 15 | 26,169,495 | 22,718,447 | 17,518,274 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 16 | 1,449,410 | 89,373 | 149,890 |
| බොල් හා අඩමාන ණය | | 6,219,283 | 2,282,976 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ලාභය | - | 24,580,948 | 10,245,624 | 1,147,240 |
| අඩු කළා : | | | | |
| ක්ෂය වීම් | | 1,934,578 | 2,244,276 | - |
| | | 22,646,370 | 8,001,348 | 1,147,240 |
| අඩු කළා : | | | | |
| මූල්‍ය පිරිවැය | 17 | 1,208,428 | 462,113 | 133,477 |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/(අලාභය) | | 21,437,942 | 7,539,235 | 1,013,763 |

# ශේෂ පත්‍රය

දෙසැම්බර් මස 31 දිනට

ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

| වත්කම් | සටහන් | 2012<br>රු. | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 18 | 20,144,197 | 7,093,233 | 10,468,442 |
| ආයතනික ව්‍යුහය | | - | - | 50,000 |
| ස්ථාවර තැන්පතු | 19 | 20,800,000 | 800,000 | 800,000 |
| **ජංගම වත්කම්** | | | | |
| වෙළඳ හා ලැබිය යුතු වෙනත් වත්කම් | 20 | 131,503,883 | 136,875,538 | 81,081,597 |
| තැන්පතු හා පෙර ගෙවුම් | 21 | 100,000 | 3,121,440 | 3,323,863 |
| මුදල් හා මුදල් සමාන දෑ | 22 | 45,554,440 | 34,121,116 | 10,382,101 |
| **මුළු වත්කම්** | | 218,102,520 | 182,011,328 | 106,106,004 |
| **ස්කන්ධය හා වගකීම්** | | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | | | |
| සමුච්චිත ලාභය / (අලාභය) | 23 | 26,194,953 | 9,100,002 | 12,540,425 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| රාජ්‍ය ආයතන සැපයූ අරමුදල් | 24 | - | 1,344,176 | 1,344,176 |
| ගෙවිය යුතු පාරිතෝෂික දීමනා | 25 | 4,053,061 | 3,516,376 | 2,030,428 |
| කල්බදු ණය | 26 | 1,375,041 | 1,986,497 | 739,618 |
| මහාභාණ්ඩාගාර ණය | | 9,300,000 | | |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම් | 27 | 177,053,214 | 164,307,848 | 89,451,357 |
| අත්තිකාරම් ලැබීම් | | 126,252 | 1,756,429 | - |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 218,102,520 | 182,011,328 | 106,106,004 |

සත්‍ය බවට අධ්‍යක්ෂකවරු විසින් සහතික කරන ලදී:

අත්සන් කළේ,

ප්‍රදීප් එදිරිසිංහ
**සභාපති**
**සැලසිනෙ රූපවාහිනී ආයතනය**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| **දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා** | 2012 | 2011 |
|---|---|---|
| **ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී** | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහයන්** | | |
| ආදායම් බද්දට පෙර ශුද්ධ ලාභය | 21,437,942.00 | 7,539,235.00 |
| **ගැළපීම :** | | |
| පොළී වියදම් | 343,497.00 | 208,324.00 |
| පොළී ආදායම් | (717,885.00) | (89,175.00) |
| දේපල පිරියත් හා උපකරණ මත ක්ෂය වෙන් කිරීම | 1,934,578.00 | 2,244,276.00 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම | 745,953.00 | 420,047.00 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම | 2,937,883.00 | 2,282,976.00 |
| සමුච්චිත අරමුදලට පසුගිය වසරේ ගැලපීම් | (4,342,992.00) | (2,762,224.00) |
| සමාගම් මූලික වියදම් | | (50,000.00) |
| දේපල පිරියත් හා උපකරණ ඉවත් කිරීමෙන් වූ පාඩුව | 2,800.00 | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **22,341,776.00** | **9,793,459.00** |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබීම් (වැඩිවීම/අඩුවීම) | 2,422,772.00 | (59,075,341.00) |
| තැන්පත් හා කලින් ගෙවීම් වල (වැඩිවීම/අඩුවීම) | 3,021,440.00 | 202,423.00 |
| රාජ්‍ය ආයතනවල ගෙවීම් (වැඩිවීම/අඩුවීම) | (1,344,176.00) | - |
| ණය ලබා ගැනීම් වල පොලිය (වැඩිවීම්/අඩුවීම) | (611,456.00) | 1,246,879.00 |
| වෙළෙඳ හා අනිකුත් ගෙවීම් වල (වැඩිවීම්/අඩුවීම්) | 12,745,366.00 | 74,856,491.00 |
| ලබන ලද අත්තිකාරම් වල (වැඩිවීම්/අඩුවීම්) | (1,630,177.00) | 1,756,429.00 |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **36,956,545.00** | **28,780,340.00** |
| පොළී ගෙවීම් | (343,497.00) | 208,324.00 |
| ආදායම් බදු ගෙවීම් | | |
| පාරිතෝෂික ගෙවීම් | (209,268.00) | (194,117.00) |

| දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 |
|---|---|---|
| ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්** | **36,403,780.00** | **28,377,890.00** |
| ආයෝජන ක්‍රියාවලියේ මුල්‍ය ප්‍රකාශය | | |
| දේපල පිරියත හා උපකරණ ඉවත් කිරීමෙන් ලද මුදල් | 2,000.00 | |
| දේපල පිරියත හා උපකරණ මිලට ගැනීම් | (14,990,341.00) | (4,728,059.00) |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | (20,000,000.00) | - |
| පොලී ආදායම් | 717,885.00 | 89,175.00 |
| **මෙහෙයුම් ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(34,270,456.00)** | **(4,638,884.00)** |
| **මුල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | |
| භාණ්ඩාගාර ණය ලැබීම් | 9,300,000.00 | |
| ණය නැවත ගෙවීම් | | |
| **මුල්‍ය ක්‍රියාවලියේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **9,300,000.00** | |
| **මුදල් හා ද්‍රවශීලතාවයේ ශුද්ධ වැඩිවීම** | **11,433,324.00** | **23,739,015.00** |
| **වසර මුල මුදල් හා ද්‍රවශීලතාවය** | **34,121,116.00** | **10,382,101.00** |
| **වසර අවසානයේ මුදල් හා ද්‍රවශීලතාවය** | **45,554,440.00** | **34,121,116.00** |

# මූල්‍ය වාර්තා සඳහා සටහන්

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **11. සේවා සැපයීමෙන් ලබන ආදායම** | | | |
| නිෂ්පාදන | 27,611,388 | 24,403,033 | 6,541,162 |
| ග්‍රැෆික් | 38,617,520 | 11,464,431 | 8,382,823 |
| උපලේඛනගත කිරීම | 328,408,933 | 242,425,047 | 89,096,089 |
| වෙනත් | 43,301,580 | 102,025,127 | 39,570,812 |
| | 437,939,421 | 380,317,637 | 143,590,886 |
| **12. සෘජු පිරිවැය** | | | |
| නිෂ්පාදන වියදම් | 14,015,088 | 16,979,018 | 4,158,345 |
| ග්‍රැෆික් වියදම් | 31,884,512 | 9,870,442 | 6,826,290 |
| උපලේඛනගත වියදම් | 286,912,288 | 230,949,632 | 78,835,180 |
| වෙනත් වියදම් | 40,126,999 | 84,055,091 | 34,044,208 |
| | 372,938,887 | 341,854,183 | 123,864,022 |
| **13. වෙනත් මෙහෙයුම් ආදායම්** | | | |
| සේවක ණය පොලී | 34,612 | 9,495 | 6,106 |
| බැංකු පොලී | 683,273 | 79,680 | 32,742 |
| වෙනත් පොලී | 24,988 | 126,405 | 26,000 |
| සැපයුම්කරුවන් ලියාපදිංචිය | 28,000 | 98,350 | 19,940 |
| Call Center ව්‍යාපෘතිය | 40,000 | - | - |
| | 810,873 | 313,350 | 84,788 |
| **14. බෙදාහැරීමේ වියදම්** | | | |
| ඉන්ධන | 1,229,499 | 1,018,188 | 395,499 |
| මෝටර් රථ අළුත්වැඩියාව සහ නඩත්තුව | 560,742 | 949,890 | 313,746 |
| ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීමේ ගාස්තු | 82,184 | 44,118 | 59,396 |
| ප්‍රචාරණ වියදම් | - | - | 27,265 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 4,610,740 | 740,604 | 198,505 |
| අලෙවි දිරි දීමනා | 894,170 | 688,164 | 1,838 |
| රක්ෂණ අලාභය | 14,938 | | |
| | 7,392,272 | 3,440,965 | 996,248 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **15. පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | 14,499,759 | 13,485,650 | 11,297,430 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,422,470 | 1,337,512 | 1,061,925 |
| සේවක භාරකාර අරමුදල | 284,264 | 267,503 | 212,385 |
| සේවක අතිකාල හා යැපීම් දීමනා | 835,764 | 669,467 | 422,550 |
| දූරකථන | 432,285 | 406,394 | 421,805 |
| සේවක සුභ සාධනය | 1,369,735 | 1,091,662 | 221,377 |
| තැපැල් | 34,101 | 27,956 | 29,066 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | 1,413,498 | 1,022,951 | 385,920 |
| විගණන ගාස්තු | - | 30,000 | - |
| පුහුණු කිරීමේ වැඩසටහන් | 657,078 | 24,438 | 8,500 |
| වාහන කුලී | 1,185,000 | 1,155,833 | 852,000 |
| ගොඩනැගිලි කුලී | - | - | 900,000 |
| විදුලිය | 418,502 | 647,716 | 357,228 |
| ප්‍රසාද දීමනා | 669,249 | 695,750 | 380,000 |
| පාරිතෝෂික දීමනා | 745,953 | 420,047 | 191,673 |
| අධ්‍යක්ෂක වේතන | 600,000 | 520,000 | 361,750 |
| ජලය | 119,926 | 79,788 | 56,376 |
| ලියාපදිංචි ගාස්තු | 73,589 | 21,400 | 13,500 |
| අළුත්වැඩියා හා නඩත්තු - කාර්යාලීය උපකරණ | 481,565 | 259,759 | 291,068 |
| අළුත්වැඩියා හා නඩත්තු - නිෂ්පාදන උපකරණ | 226,229 | 367,262 | 53,720 |
| පුවත්පත් වියදම් | 40,965 | 61,795 | - |
| ආගමික හා සංස්කෘතික වියදම් | 115,780 | 51,515 | - |
| සමාජීය සුභ සාධන | 212,853 | 74,050 | - |
| ගොඩනැගිලි වියදම් | 17,562 | - | - |
| වෘත්තිය ගාස්තු | 195,000 | - | - |
| ටෙන්ඩර් ගාස්තු | 17,500 | - | - |
| පරිවර්ථන ගාස්තු | 98,070 | - | - |
| කාර්යාලීය උපකරණ - අලාභය | 2,800 | - | - |
| | 26,169,495 | 22,718,447 | 17,518,274 |
| **16. වෙනත් වියදම්** | | | |
| ආර්ථික සේවා ගාස්තු | - | - | 37,173 |
| විවිධ වියදම් | 515,278 | 12,373 | 17,859 |
| නෛතික වියදම් | 429,475 | 77,000 | 94,859 |
| Call Center ව්‍යාපෘතිය | 504,657 | - | - |
| | 1,449,410 | 89,373 | 149,890 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **17. මූල්‍ය පිරිවැය** | | | |
| බැංකු ගාස්තු | 37,955 | 44,473 | 20,642 |
| බලපත්‍ර හා රක්ෂණ ගාස්තු | 826,976 | 209,316 | 82,896 |
| කල් බදු පොලී | 343,497 | 208,324 | 29,939 |
| | 1,208,428 | 462,113 | 133,477 |

**2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා**

**18. දේපළ, පිරියත හා උපකරණ**

| විස්තර | ලී බඩු සහ සවිකිරීම් | පරිගණක උපාංග | කාර්යාල උපකරණ | මෝටර් රථ | කැමරා සහ උපකරණ | ගිණුම්කරණ මෘදුකාංග | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01.01.2012 දිනට පිරිවැය | 1,217,421 | 3,384,940 | 2,027,059 | 6,759,007 | 3,213,648 | 750,000 | 17,352,074 |
| එකතු කිරීම් | 331,150 | 536,650 | 455,213 | 1,961,500 | 11,095,827 | 610,000 | 14,990,341 |
| ඉවත් කිරීම් | - | - | 18,000 | - | - | - | 18,000 |
| 31.12.2012 දින තෙක් | 1,548,571 | 3,921,590 | 2,464,272 | 8,720,507 | 14,309,475 | 1,360,000 | 32,324,415 |
| ක්ෂය වීම් 01.01.2012 දිනට | 793,249 | 2,243,040 | 1,398,935 | 2,598,488 | 3,075,128 | 150,000 | 10,258,840 |
| වර්ෂය සඳහා වියදම | 124,558 | 311,625 | 199,433 | 1,102,802 | 46,160 | 150,000 | 1,934,578 |
| ඉවත් කිරීම් | - | - | 13,200 | - | - | - | 13,200 |
| 31.12.2011 දින තෙක් | 917,807 | 2,554,665 | 1,585,168 | 3,701,290 | 3,121,288 | 300,000 | 12,180,218 |
| ශුද්ධ පොත් අගය 31.12.2011 දින තෙක් | 630,764 | 1,366,925 | 879,104 | 5,019,217 | 11,188,187 | 1,060,000 | 20,144,197 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | රු. | රු. | රු. |
| **19. ස්ථාවර තැන්පතු** | | | |
| ලංකා බැංකුව - ගිණුම් අංක 742656 | 500,000 | 500,000 | 500,000 |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73404 | 10,000,000 | - | - |
| ලංකා බැංකුව - ගිණුම් අංක 73405 | 10,000,000 | - | - |
| ප්‍රමුඛ බැංකුව - 103009002920 (ශ්‍රී ලංකා ඉතිරි කිරීම) | 300,000 | 300,000 | 300,000 |
| | 20,800,000 | 300,000 | 300,000 |
| **20. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | | |
| වෙළඳ ණය ගැතියෝ | 118,166,373 | 124,962,586 | 53,354,408 |
| උත්සව අත්තිකාරම් | 75,000 | 78,500 | 86,599 |
| සේවක ණය | 945,130 | 657,160 | 293,270 |
| වැටුප් අත්තික්කාරම් | - | 14,500 | 17,500 |
| මහනුවර ෆිනෑන්ස් | - | - | 992 |
| එකතු කළ අගය මත බදු (1/3) | - | - | 3,833,318 |
| රඳවා ගැනීමේ බදු | 4,556,283 | 4,556,283 | 4,508,794 |
| ආර්ථික සේවා ගාස්තු | 3,913,602 | 2,806,023 | 1,115,737 |
| උපාලි පුවත්පත් | 10,695 | 10,695 | 10,695 |
| සීමාසහිත එක්සත් පුවත්පත් සමාගම | 3,528,092 | 3,036,081 | 885,734 |
| විජය පුවත්පත් | 172,245 | 172,245 | 172,245 |
| ටී.වී.පී. ආයතනය | 3,004 | 3,004 | 3,004 |
| ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | - | 207,835 | 207,835 |
| ස්වාධීන රූපවාහිනිය | - | 138,557 | 138,557 |
| ලක් හඬ ගුවන්විදුලිය | - | 77,938 | 77,938 |
| එකතු කළ අගය මත බදු | - | - | 15,979,613 |
| ජාතිය ගොඩනැගීමේ බදු | - | - | 390,158 |
| ආපසු ලැබිය යුතු තැන්පතු | 100,000 | 102,550 | 2,550 |
| සේවක සුභසාධක සංගමය | - | 5,650 | 2,650 |
| සෙලින්කෝ ඉන්ෂුවරන්ස් | 33,458 | 45,931 | - |
| | 131,503,883 | 136,875,538 | 81,081,597 |
| **20. (a) වෙළඳ ණයගැතියෝ** | | | |
| වෙළඳ ණයගැතියෝ 2012 වසර තෙක් | 124,385,656 | 128,243,987 | 53,354,408 |
| අඩුකළා : | | | |
| බොල් ණය සඳහා වෙන් කිරීම් | 6,219,283 | 3,281,400 | - |
| | 118,166,373 | 124,962,586 | 53,354,408 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **21. තැන්පතු හා පෙර ගෙවුම්** | | | |
| බැංකු ඇපකර | 100,000 | 2,621,440 | 1,638,438 |
| පෙර ගෙවුම් | - | 500,000 | 1,685,425 |
| | 100,000 | 3,121,440 | 3,323,863 |
| **22. මුදල් හා මුදල් සමාන දෑ** | | | |
| ලංකා බැංකු ගිණුම | 18,892,885 | 26,413,618 | 8,727,444 |
| ලංකා බැංකු ඉතිරි ගිණුම | 26,661,555 | 7,410,266 | 1,625 |
| මර්චන්ට් බැංකුව | - | 5,000 | 5,000 |
| මහජන බැංකුව | - | 1,500 | 1,500 |
| අතේ ඇති මුදල් | - | 15,007 | 500 |
| නිෂ්පාදන අත්තිකාරම් | - | 222,425 | 1,646,032 |
| අනෙකුත් අත්තිකාරම් | - | 53,300 | - |
| | 45,554,440 | 34,121,116 | 10,382,101 |
| **23. සමුච්චිත ලාභ / (අලාභ)** | | | |
| ඉදිරියට ගෙනා ශේෂය | 9,100,002 | 12,540,425 | 11,288,702 |
| එකතු කළා : කපා හරින ලද ආරම්භක ශේෂ (උපලේඛනය අ) | 1,433,174 | 340,012 | 298,590 |
| | 10,533,176 | 12,880,437 | 11,587,292 |
| අඩු කළා : පෙර වසරේ ගැළපීම් (උපලේඛනය ආ) | 5,776,166 | (11,319,669) | (60,630) |
| | 4,757,010 | 1,560,767 | 11,526,662 |
| | 21,437,942 | 7,539,235 | 1,013,763 |
| වසර සඳහා ලාභය / (අලාභය) | 26,194,953 | 9,100,002 | 12,540,425 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **23. (අ) කපා හරින ලද ආරම්භක ශේෂයන්** | - | - | 4,400 |
| අධ්‍යක්ෂක වේතන | - | - | 114,000 |
| ප්‍රසාද දීමනා | - | - | 7,176 |
| බැංකු ණය | - | - | 13,000 |
| මෙහෙයුම් සඳහා ණය | - | - | 520 |
| පන්හිඳ රක්ෂණය | - | - | 1,540 |
| ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය | - | - | 2,250 |
| දිරි දීමනා | - | - | 146,400 |
| රඳවා ගැනීමේ බද්ද | - | - | 9,304 |
| ජංගම දුරකථන ගාස්තු | - | - | - |
| සේව අර්ථසාධක අරමුදල | - | 173,895 | - |
| සේවා භාරකාර අරමුදල | - | 141,117 | - |
| ආයතන ව්‍යුහය | - | 25,000 | - |
| අවලංගු කරන ලද චෙක්පත් | 80,000 | - | - |
| පාරිතෝෂික ගැලපීම් | 8,998 | - | - |
| රාජ්‍ය ආයතනය සැපයූ අරමුදල් | 1,344,176 | - | - |
| | 1,433,174 | 340,012 | 298,590 |
| **20. (ආ) පසුගිය වසරේ ගැළපීම්** | | | |
| විගණන ගාස්තු | - | 132,451 | 30,630 |
| ආර්ථික සේවා ගාස්තු | - | 187,237 | - |
| විදුලිය | - | 141,922 | - |
| පාරිතෝෂික දීමනා | - | 1,265,127 | - |
| ආපදා ණය | 6,000 | 202,408 | - |
| උත්සව අත්තිකාරම් | 3,500 | 42,099 | - |
| ණය ගැතියෝ | 5,742,616 | 178,606 | - |
| මහනුවර ෆිනෑන්ස් | - | 992 | - |
| ගණකාධිකරන ගාස්තු | - | - | 30,000 |
| ක්ෂය වීම පෙර වර්ෂ සඳහා | - | 8,014,565 | - |
| ණය ගැතියෝ | - | 654,261 | - |
| බැංකු ඇපකර | - | 500,000 | - |
| වැටුප් අත්තිකාරම් | 14,500 | - | - |
| ලැබිය යුතු තැන්පතු | 2,550 | - | - |
| මර්චන්ට් බැංකුව | 5,000 | - | - |
| පීපල්ස් බැංකු | 1,500 | - | - |
| අතඉතිරි මුදල් | 500 | - | - |
| | 5,776,166 | 11,319,669 | 60,630 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | | රු. | රු. | රු. |
| **24. රාජ්‍ය ආයතන මඟින් සැපයු අරමුදල්** | | | | |
| රාජ්‍ය ආයතන මඟින් සැපයු අරමුදල් | | - | 1,344,176 | 1,344,176 |
| | | - | 1,344,176 | 1,344,176 |
| **25. ගෙවිය යුතු පාරිතෝෂික දීමනා** | | | | |
| ඉ/ගෙ ශේෂය | | 3,516,376 | | |
| එකතු කළා: වර්ෂය සඳහා පාරිතෝෂික වියදම් | | 745,953 | | |
| | | 4,262,329 | | |
| අඩු කිරීම් : පාරිතෝෂික ගෙවීම් | | (209,268) | | |
| ගෙවිය යුතු පාරිතෝෂික දීමනා | | 4,053,061 | 3,516,376 | 2,030,428 |
| **26. පොලී ගෙවිය යුතු ණය** | | | | |
| ලංකා බැංකු කල් බදු ණය හිමියෝ | | | | |
| 1. මයික්‍රෝ වෑන් පීබී 9583 | | 959,541 | 1,308,465 | 1,744,620 |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (348,924) | (348,924) | (87,231) |
| | | 610,617 | 959,541 | 1,657,389 |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | | |
| ලංකා බැංකු බදු වාරික | 256,412 | | | |
| ලංකා බැංකු බදු පොලී | 92,512 | (348,924) | (348,924) | (348,924) |
| | | 261,693 | 610,617 | 1,308,465 |
| විලම්බිත නොවන පොලී | 65,190 | | - | |
| වසර තුළ කළ ගෙවීම් | (125,831) | (60,641) | 65,104 | (568,847) |
| | | 322,334 | 545,513 | 739,618 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | | රු. | රු. | රු. |
| 2. බජාජ් ත්‍රීවීලර් වයි.කේ 3144 | | 279,150 | 401,976 | |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (133,992) | (122,826) | |
| | | 145,158 | 279,150 | |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | | |
| ලංකා බැංකු බදු වාරික | 124,381 | | | |
| ලංකා බැංකු බදු පොලී | 9,611 | (133,992) | (133,992) | |
| | | 11,166 | 145,158 | |
| විලම්බිත නොවන පොලී | 35,405 | | | |
| වසර තුළ කළ ගෙවීම් | (25,793) | 9,612 | 35,405 | |
| | | 1,554 | 109,753 | |
| 3. මිට්සුබිෂි එල්.300 - වෑන් පි. ඩී. - 0578 | | 2,320,411 | 2,359,740 | |
| අඩු කළා : වසර තුළ කළ ගෙවීම් | | (471,948) | (39,329) | |
| | | 1,848,463 | 2,320,411 | |
| අඩු කළා : ජංගම වගකීම් වලට මාරු කිරීම් | | | | |
| ලංකා බැංකු බදු වාරික | 315,599 | | | |
| ලංකා බැංකු බදු පොලී | 156,349 | (471,948) | (471,948) | |
| | | 1,376,515 | 1,848,463 | |
| විලම්බිත නොවන පොලී | 517,232 | | | |
| වසර තුළ කළ ගෙවීම් | (191,870) | 325,362 | 517,232 | |
| | | 1,051,153 | 1,331,231 | |
| මුළු එකතුව | | 1,375,041 | 1,986,497 | 739,618 |
| **27. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ** | | | | |
| වෙළඳාම් සඳහා කලයුතු ගෙවීම් (අ) | | 176,098,350 | 163,352,984 | 89,102,433 |
| බදු ණය හිමියන් (ආ) | | 954,864 | 954,864 | 348,924 |
| | | 177,053,214 | 164,307,848 | 89.451,357 |

| 2012 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| (ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී) | රු. | රු. | රු. |
| **27. (අ) වෙළඳාම් සඳහා කලයුතු ගෙවීම්** | | | |
| වෙළඳ ණය හිමියෝ | 106,431,355 | 116,665,200 | 42,695,745 |
| සේවක අර්ථසාධක අරමුදල | 6,559 | 202,455 | 173,895 |
| සේවක භාරකාර අරමුදල | - | 24,295 | 141,117 |
| අතිකාල හා යැපීම් දීමනා | 41,396 | 49,322 | 32,144 |
| මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය | - | 65,350 | - |
| සණස සමිතිය | 43,120 | 43,120 | 43,120 |
| දුරකථන වියදම් | 33,369 | 40,837 | 54,769 |
| ජලය | - | 6,800 | - |
| විදුලිය | 637,365 | 347,365 | 203,013 |
| ගෙවිය යුතු කාර්යාල ආකෘති වියදම් | - | - | 25,000 |
| අලෙවි දිරි දීමනා | 386,808 | 457,767 | 288,617 |
| එකතු කළ අගය මත බද්ද | 54,974,145 | 35,917,495 | 40,673,595 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 10,730,024 | 7,945,568 | 3,836,641 |
| රඳවා ගැනීමේ බද්ද | - | - | 8,458 |
| ගෙවිය යුතු ගොඩනැගිලි කුලී | 900,000 | 900,000 | 900,000 |
| ආර්ථික සේවා ගාස්තුව | 313,858 | 635,592 | |
| මෙට්‍රොපොලිටන් කාර්යාලය | - | - | 26,320 |
| විගණන ගාස්තුව | 30,000 | 30,000 | |
| ඉන්ධන | 20,351 | 21,818 | |
| Ministry of mass Media & Information (Vehicle) | 1,550,000 | | - |
| | 176,098,350 | 163,352,984 | 89,102,433 |
| **27. (ආ) බදු ණය හිමියන්** | | | |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් මයික්‍රෝ වෑන් පීබී 9583 | 959,541 | 1,308,465 | 1,657,389 |
| අඩු කළා : | | | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | (256,412) | (223,093) | (859,375) |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | (92,512) | (125,831) | (449,090) |
| | 348,924 | 348,924 | 348,924 |

| 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2012 | 2011 | 2010 |
|---|---|---|---|
| **(ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී)** | **රු.** | **රු.** | **රු.** |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් බජාජ් ත්‍රීවීලර් වයි.කේ 3144 | 145,158 | 279,150 | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | 124,382 | (108,199) | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | 9,610 | (25,793) | |
| | 133,992 | 133,992 | |
| ලංකා බැංකු ණය හිමියන්ට කළ යුතු ගෙවීම් මිට්සුබිෂි එල්.300 - වෑන් පි. ඞී. - 0578 | 1,848,463 | 2,320,411 | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු වාරික | 315,599 | (280,078) | |
| ගෙවිය යුතු ලංකා බැංකු බදු පොලී | 156,349 | (191,870) | |
| | 471,948 | 471,948 | |
| මුළු එකතුව | 954,864 | 954,864 | 348,924 |

**28. සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරවු කිරීම (එස්.එල්.ඒ.එස්. 30)**

| නම | තනතුර | සම්බන්ධතා පාර්ශව ගනුදෙනු පිළිබඳ ස්වභාවය | ලිපිනය |
|---|---|---|---|
| 01. ප්‍රදීප් එදිරිසිංහ | සභාපති | නැත | නො. 283/7, ගාලුපාර, කොල්ලුපිටිය, කොළඹ 03. |
| 02. ඊ. එම්. ඒ. ආර්. ඒකනායක | සාමාන්‍යාධිකාරී | නැත | නො. 220, ගැමුණු මාවත, රාජගිරිය |

**2012 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එකිනෙක පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශව ගනුදෙනු සිදුනොවිය.**

# 2012 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ විගණකාධිපති තුමාගේ මතය

2012 වසරේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවේ මෙම ආයතනය පිළිබඳ දක්වා ඇති විගණකාධිපති මතය පහත දැක්වේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සැලසිනේ රූපවාහිනි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

විගණකාධිපතිතුමා විසින් අප ආයතනය පිළිබඳ දී ඇති ඉහත සඳහන් සහතිකය, වසර 30 කට පසු පිට පිටම දෙවන වරටත් මෙම ආයතනය ලබාගත් සුවිශේෂී ජයග්‍රහණයක් බව සතුටින් ප්‍රකාශ කරන අතර, මෙවැනි සහතිකයක් සැලසිනෙ ආයතනයට ලබා ගැනීමට ඔබ දැක්වූ දායකත්වයට ආයතනයේ සමස්ත කාර්යය මණ්ඩලයටම මාගේ කෘතඥතාවය පල කර සිටිමි.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதித்திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: ටීඑම්/ථ/එස්සීටීඅයි/එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2013 ජුනි 21 දින. |

සභාපති,
සැලසිනේ රූපවාහිනී ආයතනය.

**සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 ආයතනය පිහිටුවීම

මෙම ආයතනය 2001 දෙසැම්බර් 20 දින ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරා ගෙන තිබුණත්, එහි අරමුණු හා කාර්යයන් නිශ්චය කර බලතල ක්‍රියාත්මක කිරීමට පනතකින් හෝ වෙනයම් නීතියකින් විධිවිධාන සලසා නොතිබුණි. මෙම ආයතනය " සැලසිනේ ලිමිටඩ් " ලෙස සමාගම් පනත යටතේ පොදු සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සැලසිනේ රූපවාහිනී ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මුල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු හා ගොඩනැගිලි කුලී සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 2011 වර්ෂය තුළදී නොමිලේ පවරා දී තිබුණ කෘෘ කැබ් රථයක් සමාලෝචිත වර්ෂයේදී රු.1,550,000 කට තක්සේරුකර වත්කම් ගිණුමට ගෙන තිබුණද, එම තක්සේරු අගය ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කරන ලද රු.මිලියන 20 තැන්පතු සඳහා වූ පොලී අදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට බොල් ණය හා අඩමාණ ණය ගැලපීමට පෙර ණයගැති ශේෂය රු.128,243,987 ක් වුවද, 2012 ජනවාරි 01 දින ණයගැතියන්ගේ ලෙජර ගිණුමට ආරම්භක ශේෂය ලෙස බොල්ණය හා අඩමාණ ණය ගැලපූ වටිනාකම වූ රු.124,962,586 ගෙන තිබුණි. තවද 2012 වර්ෂයේදී අඩමාණ ණය වෙන්කිරීම් ලෙස රු. 6,219,283 අඩමාණ ණය වෙන්කිරීම් ගිණුමක් මගින් නොගලපා බොල් ණය කපාහැරීමක් ලෙස ආදායමට එරෙහිව ගලපා තිබුණි. ණයගැතියන් සඳහා බොල්ණය හා අඩමාණ ණය වෙන්කිරීම වෙනුවෙන් ලෙජර ගිණුම් පවත්වා ගත යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

### 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විකුණුම්, විකුණුම් ලෙජරය අනුව රු. 436,802,868 ක් වූ අතර ප්‍රධාන ලෙජරයේ විකුණුම් ගිණුම් අනුව එය රු. 437,939,421 ක් වී තිබුණි. ඒ අනුව විකුණුම් රු. 1,136,553 ක වෙනසක් විය.

(ආ) ණයගැති උපලේඛනය හා ණයගැති ලෙජරය අතර රු.183,230 ක වෙනසක් විය.

(ඇ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද ණයගැති ලෙජරය අනුව කේවල ණයගැතියන්ගේ ආරම්භක ශේෂ වල එකතුව රු. 56,439,633 ක් හා ණයගැති ලෙජර ආරම්භක ශේෂය රු. 128,243,987 ක් බැවින් රු. 71,804,354 ක වෙනසක් විය. 2012 දෙසැම්බර් 31 දිනට ණයගැති උපලේඛනය අනුව එකතුව රු. 9,845,775 ක් වූ ණයගැති ශේෂ 20 ක් ණයගැති ලෙජරයේ කේවල ගිණුම්වල දක්වා නොතිබුණි.

2.2.3 **ලැබිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණයගැති උපලේඛනය අනුව ණයගැති ශේෂ 99 නිරීක්ෂණය වුවද, ණයගැති ශේෂ 42 ක් සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි යවා නොතිබුණි.

(ආ) ණයගැති කාලවිශ්ලේෂණය අනුව දින 90 කට වඩා වැඩි ණයගැති ශේෂ වටිනාකම රු. 49,663,465 ක් වූ අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 40 ක් විය. තවද එම ණයගැතියන් තුල එකතුව රු. 6,611,743 ක් වූ 2006 වසරට පෙර සිට පැවැත එන ශේෂ විය. ලෙජරයේ වූ එම ශේෂ සඳහා කේවල ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි.

2.2.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ වෙළඳ ණයහිමියෝ හා දේපල, පිරියත හා උපකරණ, ලැබිය යුතු කොමිස්, ජාතිය ගොඩනැගීමේ බදු පිළිවෙලින් රු. 106,431,355, රු. 17,352,074, රු. 3,528,092, ක් හා රු.10,730,024 සඳහා නිසි පරිදි පිළියෙල කළ කාල විශ්ලේෂණ, උපලේඛන, ශේෂ සනාථ ලිපි සහ ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, බදු ලිපිගොනු යනාදි සාක්ෂි නොතිබුණි.

(ආ) 2012 ගිණුම් වර්ෂය තුලදී ජර්නල් සටහන් 364 ක් මගින් ගිණුම්වල ගැලපීම් කර තිබුණද, එම ජර්නල් සටහන් පරීක්ෂාව සඳහා ජර්නල් වවුචර්, අදාල ගණනය කිරීම් හා උපකාරක ලියවිලි යනාදිය විගණනය වෙත ඉදිරිපත් නොකළ බැවින් එම ජර්නල් සටහන් මගින් කරන ලද ගැලපීම් වල නිවැරදිතාවය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය.

2.2.5 **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- | --- |
| (අ) | 2000 ජුනි 27 දිනැති අංක පීඑෆ් / පීඊ / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වටිනාකම රු. 2,500,000 ක් වූ ස්ථාවර තැන්පතු වල කරන ලද ආයෝජන සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (ඇ) ඡේදය | ආයතනයේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේඛණගත කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පොදු ආකෘති පත්‍ර 287 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය හා පොදු ආකෘති පත්‍ර 288 ප්‍රකාර ස්ථාවර වත්කම් ලෙජරය පවත්වා නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

3.1. **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 21,437,942 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ වූ බදු පූර්ව ශුද්ධ ලාභය රු. 7,539,235 ක් වුයෙන් බදු පූර්ව ලාභයෙහි රු. 13,898,707 ක් හෙවත් සියයට 184 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 57,621,784 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3.2 **ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

බාහිර ආයතන දෙකක් විසින් නිර්මාණ කටයුතු වලට අදාල මුදල් ලබාගැනීම සඳහා නඩු දෙකක් හා හිටපු සේවකයින් හතරදෙනෙකු වැඩතහනමට ලක්කිරීම හේතුවෙන් නඩු හතරක් පවරා තිබූ අතර 2012 දෙසැම්බර් 31 දිනට නඩු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම රු. 328,075 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන කාර්යයන් 14 කින්ද නිර්මාණශීලී කටයුතු 29 කින්ද උපලේඛනගත කිරීම් 246 කින්ද විශේෂ ව්‍යාපෘති 7 කින්ද වූ වර්ධනය සමස්ත ආදායම 15% කින් ඉහල යාම කෙරෙහි බලපා තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2012 වර්ෂයේදී එකතු කළ අගය මත බදු සඳහා කාර්තුමය බදු වාර්තා දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත යවා තිබුණද, එයට අදාල මුදල් වටිනාකම වු රු. 18,613,695 දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොයවා ආයතනයේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි. එම ගිණුම් ශේෂය ශේෂපත්‍රයේ මුදල් හා මුදල් සමාන විෂයයන් යටතේ දක්වා තිබුණි.

### 4.3 කාර්යමණ්ඩල පරිපාලනය

2012 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 27 ක් වුවද, 48 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් වු අතර එහි ස්ථිර 15 දෙනෙකු හා තාවකාලික 33 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

### 4.4 වාහන උපයෝජනය

ආයතනය විසින් කුලී පදනම මත වාහන ලබාගැනීමේදී 2003 මාර්තු 28 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ එම්එෆ්/ටීආර්/01/2003 ලිපිය ප්‍රකාරව වාහන කුලියට ලබාගත හැකි උපරිම වටිනාකම රු.40,000 ක් වුවත්, ඊට පටහැනිව මාසික කුලිය රු. 65,000 සහ රු. 45,000 ක් ගෙවීමේ පදනම මත වාහන දෙකක් ලබා ගෙන තිබුණි. 2012 වර්ෂය තුල ඒ සඳහා වැය කළ වියදම රු. 1,185,000 ක් වී තිබුණි. මෙම වාහන කුලී පදනම මත ලබාගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාර ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවද, සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2013 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

2011-2013 කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කරන ලද සංයුක්ත සැලැස්මෙහි 2012 හි කළයුතු කාර්යයන් වශයෙන් රූපවාහිනී නාලිකාවක පැයක පමණ ගුවන් කාලයක් වෙන්කර ඒ සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් පෙන්වීමට කටයුතු කිරීම, මහින්ද චින්තන වැඩසටහන යටතේ අවසන් කර ඇති ව්‍යාපෘතීන් පිළිබඳ රූපවාහිනී වැඩසටහන් තරඟාවලියක් පැවැත්වීම හඳුනාගෙන තිබුණද එම කාර්යයන් ඉටුකර නොතිබුණි.

## 5.3 අයවැය පාලනය

2012 වර්ෂයේ අයවැය ලේඛනයක් සකස් කිරීමේදී එක් එක් වැඩසටහන් සඳහා අයවැයගත ආදායම හා වියදම වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන විධිමත්ව සකස් කර නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගිණුම් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.5 අධ්‍යක්ෂ මණ්ඩලය

2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර පෙන්වා දෙන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ණයගැතියන්
(ආ) බදු ගෙවීම
(ඇ) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම
(ඈ) ගිණුම්කරණය

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති.

1.4 - <u>ආයතනය පිහිටුවීම</u>

2012.10.05 දින පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී සාකච්ඡා කළ පරිදි සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කිරීමට අදාළ ශක්‍යතා වාර්තාව අමාත්‍යංශය ගරු අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කර ඇති අතර එය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා, අමාත්‍ය මණ්ඩල සන්දේශය ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

2.2.1. - <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) අමාත්‍යංශ ලේකම්ගේ අංක MM1/7/1/20 හා 2013.02.14 ලිපියට අනුව අංක 613396 දරණ චෙක්පතින් රු: 96,904ක් ගෙවීමෙන් 2000-2010 දක්වා සියලුම වසරවල විගණන ගාස්තු නිරවුල් කර ඇත. 2011 සහ 2012 වසරවල බිල්පත් නොලැබීම නිසා ගෙවීම් කර නැත. බිල්පත් ලද වහාම නිරවුල් කල හැක.

ගොඩනැගිලි කුලී, ගෙවීමක් හෝ කුලී ගිවිසුමක්, හෝ නොමැති නිසාත් ප්‍රතිපාදන වෙන් කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිනි.

(ආ) පසුගිය වසරේ විගණනය විසින් පෙන්වා දුන් පරිදි මෙම රථය තක්සේරු කොට වත්කම් ගිණුමට ගැනීමේදී ඊට සාපේක්ෂව ඇතුලත් විය යුතු බැර සටහන් ඇතුලත් කිරීමට වෙනත් විකල්පයන් නොමැති නිසා අමාත්‍යාංශයෙන් බිල්පත් හුවා දැක්වීමට (අයිතිය) එලෙස ගිණුම් ගත කරන ලදී. මෙහි නිවැරදිභාවය තවදුරටත් පරීක්ෂා කර සංශෝධනය කිරීමට කටයුතු කරමි.

(ඇ) මෙයට අදාළ පොලිය වසර තුල බැංකු ගිණුම්වලට ප්‍රේරණය වී නැති බැවින් ද, එම ශේෂ සහතික පත් ලැබුනේ ගිණුම් වාර්තා සැකසීමෙන් පසුව බැවින් ද, පොලී ගණනය කර ගිණුම් නොවීම අතපසුවී ඇත. එය මීළඟ ගිණුම් වාර්තාවේ නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.

(ඈ) පැවති ආයතනික ගිණුම් පරිපාටියට අනුව බොල්ණය ප්‍රතිපාදන වෙන්කර ණය ගැතියන්ගෙන් අඩුකර දැක්වීම නිසා පෙර වර්ෂ වල සිටම බොල්ණය සංචිත ගිණුමක් විවෘත කර නොතිබුණි. එබැවින් ප්‍රවර්තන වර්ෂයේදී එලෙසම ගිණුම් ගත කර ඇත. එහෙත් 2012 වසරේ වෙන්කළ බොල්ණය ප්‍රතිපාදනය වෙනුවෙන් බොල්ණය සංචිත ගිණුමක් විවෘත කර ඉදිරි වර්ෂ වල සිටම ඉදිරියට ගෙනයාමට ගිණුම් සංශෝධනය කරමි.

2.2.2 - නොසැසුඳුන පාලන ගිණුම්

(අ) විකුණුම් ගිණුම් අනුව විකුණුම් වටිනාකම වූ රු. 437,936,44. නිවැරදි වේ. එය අනෙකුත් අදාල සියලුම ගිණුම් හා එකඟ වේ. පෙන්වා දී ඇති වෙනස විකුණුම් ලෙජරයට ඇතුලත් කළ පරිගණක වාර්ෂික වාර්තා වල ඇති වෙනසේ එකතුවකි. පරිගණක වැඩසටහන නිවැරදි කිරීමට කටයුතු කළෙමි.

(ආ) කේවල ගිණුම් 5 ආරම්භක ශේෂයන් වල වෙනසක් හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. එසේ වුවත් එම කේවල ගිණුම් වල අවසාන ශේෂයන් නිවැරදි වේ. එබැවින් ගිණුම් වාර්තාවල නිවැරදිව දැක්වේ. ඒ ආරම්භක ශේෂයන්වල වෙනසට හේතුව සංශෝධනය කර නොපමාව නැවත වාර්තා කරමි.

(ඇ) ණයගැති ලෙජරයේ කේවල ගිණුම් කිහිපයක පමණක් ආරම්භක ශේෂයන් ඇතුලත් වී නැත. ඊට හේතුව ඇත්තේ නව පරිගණක වැඩ සටහන් ආරම්භක ණයගැති ශේෂයන් වල නොගැළපීමකි. ඊට හේතුව ඇත්තේ නව පරිගණක වැඩසටහනේ ගැටළුවක් බව අනාවරණය විය. වෙනසට හේතුව එය විය. එසේ වුවද වර්ෂ අවසානයේ සියලු ණයගැති ශේෂයන් නිවැරදිව පරිගණක වැඩසටහන් සැකසේ. මේ පිළිබඳව වැඩ සටහන නිර්මානය කළ ආයතනයට දැනුම් දී ඒ පිළිබඳව අධ්‍යයනය කර වැඩසටහන නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. එය නිමකළ වහාම ණයගැති ලෙජරය නියමිත ලෙස සකසා මසක් ඇතුළත ඔබ වෙත ඉදිරිපත් කළ හැක.

2.2.3 - ලැබිය යුතු ගිණුම්

(අ) 2012.12.31 දිනට ණය ගැතියන්ගේ අවසන් ශේෂ වල යම් යම් පැහැදිලි කරගැනීම් දක්නට ලැබුණි. නැවත පරීක්ෂා කළ යුතු ණය ශේෂ හැර අනිකුත් සියළුම ණය ශේෂ සඳහා ලිපි යවා තිබුණි. ඒ අනුව පරිගණක සටහන අනුව ශේෂය තහවුරු කරගැනීමට හා සනාථ නොවූ ඒවා දැන් නිවැරදි කර ඇත.

(ආ) මෙම ශේෂය ඉතා පැරණි වසරවල සිට ගිණුම්වල දැක්වෙන අතර කිසිදු විස්තරයන් සොයා ගැනීමට නොහැකි බව 2012.10.05 රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී පැහැදිලි කෙරිණි. ඒ අනුව මෙම ශේෂය කපා හැරීමට කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එබැවින් ඉතා ඉක්මණින් මෙය ණයගැති ලේඛනයෙන් කපා හැරීම සිදු වේ.

(ඇ) 2011 වසරේ ගිණුම් සැකසූ පැරණි ගිණුම් පද්ධතිය වෙනුවට 2012 වසරේ මුල සිට නව ගිණුම් පද්ධතිය ස්ථාපිත කරන ලදී. ඒ අනුව සමහර සංශෝධිත දත්ත 2012 වසරේ නව ගිණුම් පද්ධතියට ඇතුලත් විය. ඒ අනුව මෙම වෙනස ඇති වී තිබේ. මේ ගැන වඩාත් විස්තරාත්මක විවරනයක් නොපමාව ඔබ වෙත ඉදිරිපත් කරමි.

2.2.4 - විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

(අ) වෙළඳ ණය හිමියන් - ණය හිමි ලෙජරය ඔබ වෙත ඉදිරිපත් කර ඇත. ණය හිමි ලේඛනය මාසයක් ඇතුලත ඔබ වෙත ඉදිරිපත් කරමි.

දේපල පිරියත් හා උපකරණ - මෙහි වර්ගීකරණයක් අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇත. එහි ඇතුලත් සෑම අංශයක්ම ඉන්වෙන්ට්‍රි පොත්වල ඇතුලත් වේ. ඒ හැර මෙම මිලට ගැනීම් පිළිබඳ ලිපි ගොනු නිරවුල්ව ඉදිරිපත් කළ හැකිවේ. ස්ථාවර වත්කම් ලේඛනය 2012.04.11 දින විගණනය යවන ලදී.

ලැබිය යුතු කොමිස් - මෙය EDB ආයතනට පමණක් සපයන ලද පුවත්පත් දැන්වීම් වෙනුවෙන් ලේක්හවුස් ආයතනයෙන් අයවිය යුතු කොමිස් වේ. ඊට අදාළ පුවත් පත් දැන්වීම් පරිගණක වැඩ සටහන් අයුරින් ලබාගත හැක. මීට අදාළ ලිපි ගොනු ද ඉදිරිපත් කළ හැක.

ඇප තැන්පත් - මෙයට අදාළ සාක්ෂි හා ගිවිසුම් 2012.04.10 දින විභාගයට භාර දී ඇත. ඊට අදාළ ලිපි ගොනු ද ඉදිරිපත් කළ හැක.

ක්ෂය වෙන්කිරීම - ආයතනයේ ගිණුම් පරිපාටියට අනුව ක්ෂය වෙන්කිරීම් කරනු ලබන අතර ගිණුම් වාර්තා සමඟ ඉදිරිපත් කළ පැහැදිලි කිරීම් වල 3.5 හි සඳහන් වේ. ඊට අමතරව ක්ෂය පිළිබඳ විස්තරාත්මක ලේඛනය 2013.04.01 දින විගණනය වෙත යවා තිබේ.

ජාතිය ගොඩනැගීමේ බදු - අදාළ ජාතිය ගොඩනැගීමේ බදු සම්බන්ධ ලිපිගොනු තිබේ. එය ඉදිරිපත් කළ හැකිය.

(ආ) පෙර වර්ෂ වල ගිණුම් ගත කළ ජර්නල් සටහන් සඳහා වවුචරයන් ඇතුලත් කර නැති බැවින් ඒ පිළිබඳව දැනුවත් වී නොමැති නිසා එම ප්‍රමාද දෝෂය සිදුවී ඇත. එතකුදු 2012 වසරේ සිට ජර්නල් සටහන් සඳහා සභාපති අනුමැතිය ලබාගෙන ඇත. හැකි ඉක්මණින් එම සටහන් සඳහා ජර්නල් වවුචර් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. 2013 වසරේ සිට නියමිත ලෙස ජර්නල් සටහන් ගෙවීමට පෙර වවුචර් ඇතුලත් කිරීමට කටයුතු කරමි.

2.2.5 නීති රීති රෙගුලාසි හා කළමණාකරන තීරණවලට අනුකූල නොවීම

(අ) 2012.06.18 දින ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යංශයේ පැවති විගණන හා කලමණාකරණ රැස්වීමේ දී ලද උපදෙස් අනුව ස්ථාවර තැන්පත් ගිණුම් ආරම්භ කරන ලදී. අංක SE/ACC/3/DPST/1 හා 2011.02.11 දිනැති ලිපියෙන් සහ සමාංක 2013.02.19 ලිපි වලින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව දැනුවත් කර මේ පිළිබඳ අනුමැතිය ඉල්ලා ලිපි ඉදිරිපත් කර තිබේ.

(ආ) පොදු සමාගමක් ලෙස ස්ථාපිත වූ විගස සංවිධාන සැලැස්ම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කරමි. කාර්යය මණ්ඩලය අනුමැතිය සඳහා කළමණාකරන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර එය වැටුප් කොමිෂමට ඉදිරිපත් කර සාකච්ඡා වෙමින් පවතී. එම අනුමැතිය ලද විගස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) ස්ථාවර වත්කම් ලෙජරය සහ ස්ථාවර වත්කම් ලේඛනය 2013.04.10 දින විගණනය වෙත යවන ලදී .

(ඈ) පරිගණක උපකරණ ලේඛනයද අදාළ චක්‍රලේඛනය අනුව පිළියෙල කර 2013.04.11 දින විගණනය වෙත යවන ලදී .

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පසුගිය වකවානු වල පැවති අපගමනයක් වළක්වා ආයතනයේ සමස්ථ ව්‍යුහය මනා කලමණාකරීත්ව තුලින් මෙම ඉහළ වර්ධනය ලබා ගෙන තිබේ.

### 3.2 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

1. 2008 දැයට කිරුළ නිර්මාණ වලට අදාළ ආයතන දෙකක් සඳහා වාණිජ අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී.
2. සේවකයන් හතර දෙනෙකු සම්බන්ධව නඩු කටයුතු වේ. එම නඩු තවම විභාග වෙමින් පවතී.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 - කාර්ය සාධනය

ආදායම් 184% කින් වර්ධනය වීම තුළ මානව සම්පත් හා මූල්‍ය කලමනාකරණ කාර්යක්ෂමව මෙහෙයවීම මෙම වර්ධනයට හේතුවී ඇත.

### 4.2 - කලමනාකරණ අකාර්යක්ෂමතා

මෙම ආයතනයේ නෛතික භාවය පිළිබඳව තිබුන අවිනිශ්චිතභාවය නිසා එකතු කළ අගය මත බදු මුදල් නියම කළ ඕනෑම අවස්ථාවක ගෙවීමට හැකිවන ලෙස රාජ්‍ය බැංකුව වන ලංකා බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත් කර තිබේ. මේ පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡා කරමින් තිබේ.

4.3 - කාර්‍ය මණ්ඩල පරිපාලනය

දැනට අනුමත ආයතන කාර්යය මණ්ඩලය වූ 27, 2003 වසරේ අනුමත වූවකි. ඉන් දැනට ස්ථිර සේවක සංඛ්‍යාව 15ක් වේ. 2003 වසරට වඩා වර්තමාන ආයතනයේ ව්‍යුහය හා කාර්යභාර විශාල ප්‍රමාණයකින් ප්‍රසාරණය වී ඇත. ආදායම් 184% කින් වර්ධනය වීම ඊට සාක්ෂියකි. ඒ නිසා තාවකාලික නිලධාරීන් බඳවාගෙන ආයතනයේ කාර්යභාරය සිදුකරන ලදී. ආයතනයේ වර්තමාන කාර්යයභාරයට උචිත වන ලෙස කාර්ය මණ්ඩලය වැඩිකිරීමට කලමනාකරණ දෙපාර්තමේන්තුවට හා වැටුප් විෂමතා කමිටුව සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර අවසන් තීරණයක් ඉක්මනින් ලබා දේ යැයි බලාපොරොත්තු වේ.

4.4 වාහන උපයෝජනය

සභාපති සඳහා පාවිච්චි කළ වාහනය හදිස්සියේ නතර කිරීමට සිදුවූ බැවින් ද ඉතා හදිස්සියේ වාහනයක් සභාපති ලබාගත යුතු බැවින් ද දුරකථන මඟින් ලබාගත් බිල් සහ විස්තර මත ගිවිසුමකට එළඹ ලබාගෙන ඇත. මෙම ආයතනය සියලුම වියදම් දරනුයේ ලබාගන්නා ලද ආදායමෙන් වන අතර කිසිදු ප්‍රතිපාදනයක් රජයෙන් නොලබයි. එලෙස ආදායම් උපයන ආයතනක් වශයෙන් ඉහළම තනතුරු සඳහා උචිත වන ලෙස ප්‍රවාහන පහසුකම් පවත්වාගෙන යායුතු බැවින් සහ ඉතා ඉක්මණින් ලබාගත යුතු වූ බැවින්, දුරකථනය මඟින් ලබාගත් මිල ගණන් අනුව තනතුරට සුදුසු යැයි නිරීක්ෂණය වූ බැවින් ගිවිසුමක් යටතේ ලබාගෙන ඇත. සාමාන්‍යාධිකාරීවරයාගේ වාහනය සැප්තැම්බර් මාසයේ සිට නවතා ඇත.

5. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

පෙර වර්ෂ වල තිබුන අවසන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සම්පූර්ණයෙන්ම බැහැර කරගනිමින් 2013.03.28 දිනම 2012 අවසන් මූල්‍ය ප්‍රකාශන විගණනයට භාර දෙන ලදී. මූල්‍ය ප්‍රකාශන භාරදිය යුතු අවසාන දිනය වන 2013.02.28 වන දිනම මූල්‍ය ප්‍රකාශන භාරදිය යුතු බැවින් ද, ප්‍රධානම ගිණුම් ප්‍රකාශන එදිනම භාරදීමට අවශ්‍ය වූ හෙයින් ද, ඒ වන විට මුදල් ප්‍රවාහය සම නොවූ නිසාත් ප්‍රධාන මූල්‍ය ප්‍රකාශන විගණනයට භාරදුනි. ඊට දින කීපයකට පසු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයද නියමිත ලෙස සකසා ඔබ වෙත භාරදෙන ලදී.

5.2 සංයුක්ත සැලැස්ම

1. මෙය 2012 වසරේ දැයට කිරුළ ප්‍රදර්ශන කුටියේ දී ක්‍රියාවට නංවන ලදී.
2. මෙම වැඩ පිළිබඳ ක්‍රියාත්මක කිරීම සඳහා ගුවන් කාලය සඳහා අනුග්‍රහකයන් ලබා ගැනීම, සොයා ගැනීම ගැටළුවක් විය. මෙය ක්‍රියාත්මක කිරීමට තවදුරටත් අවශ්‍ය කටයුතු සාකච්ඡා වෙමින් පවතී.
3. මේ සඳහා අනුග්‍රාහකයින් සොයා ගැනීම ගැටළුවක් විය. එතකුදු ඒ සඳහා දැනටම අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කරමින් පවතී.

5.3 අයවැය ලේඛනමය පාලනය

2012 වර්ෂය සඳහා ආදායම් සඳහා ඒ ඒ අංශ වලට වෙන් වශයෙන් අය වැය සකස් කර තිබේ. වාර්ෂික වියදම් අයවැය ලේඛනයද සකසා තිබේ එයද ඉදිරිපත් කළ හැක. ඒ අනුව මසකින් මස ප්‍රගති සමාලෝචන පවත්වා අපගමනයන් නිවැරදි කරමින් වර්ෂය තුළ ආදායම් හා ලාභ වල සැලකිය යුතු වර්ධනයක් ලැබුවේ.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 වාර්ෂික වාර්තා අමාත්‍ය මණ්ඩලය විසින් අමත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 12/1770/537/025 න් අනුමත කරන ලදුව සභාගත කිරීම සඳහා 2013.02.13 දින ගරු සභානායකතුමා වෙත යවන ලදී. 2011 වාර්ෂික වාර්තාව අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටද කටයුතු කර ඇත. 2012 වාර්ෂික වාර්තාවේ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතී.

5.5 <u>අධ්‍යක්‍ෂක මණ්ඩලය</u>

2013 අප්‍රේල් මස අධ්‍යක්‍ෂක මණ්ඩලය පත්කර ඇත.

6. - **<u>පද්ධති හා පාලනය</u>**

(අ) <u>ණයගැතියන්</u>

2011 වසරට වඩා 2012 ණය ගැති ශේෂය මිලියන 6.7කින් අඩුකරගෙන තිබේ එය පසුගිය වසරට සාපේක්ෂව 5.4%ක වර්ධනයකි. වැඩිදුරටත් මෙම වර්ධනය වැඩිකරගැනීම සඳහා ණය එකතු කිරීමට වෙනම නිලධාරියෙකු පත්කර තිබේ. ඒ අනුව මේ වර්ෂයේ දී වඩාත් වර්ධනයක් බලාපොරොත්තුවේ.

(ආ) <u>බදු ගෙවීම</u>

ආර්ථික සේවා ගාස්තු නියමිත පරිදි දේශීය කොමසාරිස් වෙත යවා ඇත. එකතු කිරීමේ අගය මත බදු 2012 අන්තිම කාර්තුව දක්වාම මුදල් වෙන් කර තිබේ. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සමඟද මේ සම්බන්ධව සාකච්ඡා කළ අතර ඒ අනුව ආයතනයේ නෛතික භාවය ලද විගසම අදාළ බදු ගෙවීමට දැනටමත් සුදුසු පියවර ගෙන තිබේ. කිසිදු අපහසුතාවයකින් තොරව මෙම බදු ගෙවීමට හැකියාව තිබේ.

(ආ) <u>ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම</u>

2011 වසරේ විගණනය විසින් පෙන්වා දුන් ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය සකසා 2013.04.10 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදී . එහි සුළු අඩුපාඩු පිළිබඳව විගණනය විසින් උපදෙස් දුන් අතර ඒ අනුව ස්ථිර වත්කම් ලේඛනය නිසි අයුරින් පවත්වාගෙන යනු ලැබේ.

(ඇ) <u>ගිණුම් තැබීම</u>

පසුගිය වකවානුවල තිබුන දුර්වලතාවන් අධ්‍යයනය කර විධිමත් ගිණුම් පද්ධතියක් ස්ථාපිත කර ඇත. ඒ මඟින් සියළුම ගිණුම් වාර්තා හා ලබාගත හැකිවේ. ඒ අනුවය මේ වසරේ නියමිත දින ම මූල්‍ය ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමට හැකිවූයේ. මින් ඉදිරියට සියළුම ගිණුම් වාර්තා නිශ්චිත දිනටම වඩාත් නිවැරදිව ඉදිරිපත් කිරීමට හැකිවේ.

මේ නයින් වාර්තාවේ සඳහන් ප්‍රමාද දෝෂයන් සම්පූර්ණයෙන්ම නිවැරදි කර ඇති අතර ඉදිරියේදී මෙම දුර්වලතා වළක්වා ගැනීමට නිලධාරීන් සමඟ සාකච්ඡා කර සුදුසු පියවර ගෙන ඇති බැවින් එම කරුණු අවසන් වාර්තාවට ඇතුලත් නොකරන ලෙස කාරුණිකව ඉල්ලමි.

ප්‍රදීප් එදිරිසිංහ
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය




වාර්ෂික වාර්තාව ஆண்டறிக்கை ANNUAL REPORT

සැලසිනෙ
செலசினே
SELACINE
TELEVISION INSTITUTE

SLBC Training Institute Building, Independence square, Colombo 07, Sri Lanka.
Tel: +94-11-2688744
Fax: +94-11-2688745
E-mail: selacine@gmail.com
www.selacine.lk